**ශීර්ෂ 126 - අධ්‍යාපන අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

---

මෙම වාර්තාවේ 1 ඡේදයේ සිට 2 ඡේදය දක්වා අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ සිට එක් එක් ශීර්ෂයට අදාළ විගණන නිරීක්ෂණ දැක්වේ.

**1 අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු**

| ශීර්ෂ | දෙපාර්තමේන්තුවේ නම |
|---|---|
| 212 | විභාග දෙපාර්තමේන්තුව |
| 213 | අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |
| - | ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ ප්‍රකාශන මණ්ඩලය ඇවර කිරීමේ මූල්‍ය ප්‍රකාශන |

**1.1 විගණන විෂය පථය**

අධ්‍යාපන අමාත්‍යාංශය හා ඉහත 1 ඡේදයේ සඳහන් දෙපාර්තමේන්තුවල 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම්, ආදායම් ගිණුම, වාණිජ අත්තිකාරම් ගිණුම, සැසඳුම් ප්‍රකාශන හා ඇවර කිරීමේ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තා පහත සඳහන් දිනවල අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරීට හා දෙපාර්තමේන්තුවල ගණන්දීමේ නිලධාරීන් වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම්වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

| ශීර්ෂ | අමාත්‍යාංශය / දෙපාර්තමේන්තු | කළමනාකරණ විගණන වාර්තාව නිකුත් කළ දිනය |
|---|---|---|
| 126 | අධ්‍යාපන අමාත්‍යාංශය | 2015 සැප්තැම්බර් 25 |
| 212 | විභාග දෙපාර්තමේන්තුව | 2015 ඔක්තෝබර් 21 |
| 213 | අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව | 2015 ඔක්තෝබර් 21 |

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම

විසර්ජන ගිණුම්, ආදායම් ගිණුම, වානිජ අත්තිකාරම් ගිණුම, සැසඳුම් ප්‍රකාශන හා මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

### 2.1 විසර්ජන ගිණුම්

#### (අ) මුළු ප්‍රතිපාදනය හා වියදම

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු 02 ක් සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 44,046 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 43,510 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවල ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් රු.මිලියන 31 ක සිට රු.මිලියන 447 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 1.08 ක සිට සියයට 28.18 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් පැවැතුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂ | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 126 | 41,231 | 40,784 | 447 | 1.08 |
| 212 | 2,705 | 2,647 | 58 | 2.14 |
| 213 | 110 | 79 | 31 | 28.18 |
| **එකතුව** | **44,046** | **43,510** | **536** | **1.22** |

(ආ) **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් රු.මිලියන 10.6 ක් වූ ප්‍රතිපාදන විභාග දෙපාර්තමේන්තුව වෙත ලබාදී තිබුණු අතර ඉන් රු.මිලියන 8.6 ක් පමණක් උපයෝජනය කර තිබුණු අතර රු.මිලියන 2 ක් ඉතිරිවී තිබුණි.

## 2.2 ආදායම් ගිණුම

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුවක් විසින් 2014 වර්ෂය සඳහා ආදායම් සංකේතයක් සඳහා එකතුව රු.මිලියන 200 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 229.4 ක ආදායමක් රැස්කර තිබුණි. ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 114.7 ක ප්‍රමාණයකින් ආදායම් රැස්කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉක්මවීම ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | ඉක්මවීම | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 20.03.02.13 | 200 | 229.4 | 29.4 | 14.7 |

## 2.3 අත්තිකාරම් ගිණුම්

### 2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තු 02 කට අදාළ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 12601 | 820.0 | 800.7 | 675.0 | 678.7 | 2,500.0 | 1,548.0 |
| 21201 | 18.0 | 17.6 | 13.0 | 16.2 | 100.0 | 70.9 |
| 21301 | 5.5 | 5.2 | 4.0 | 6.5 | 37.0 | 17.2 |

## 2.3.2 වාණිජ අත්තිකාරම් ගිණුම්

අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවක් විසින් වාණිජ අත්තිකාරම් ගිණුම් 01 ක් පවත්වා තිබුණි.

### (අ) පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු 01 කට අදාළ වාණිජ අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | | බැරකම් | |
|---|---|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 21302 | 2,900 | 2,724 | 2,500 | 2,781.4 | 4,000 | 910.4 | 2,250 | 2,181 |

### (ආ) මූල්‍ය ප්‍රතිඵල

වාණිජ අත්තිකාරම් ගිණුමක මූල්‍ය ප්‍රතිඵල පහත පරිදි විය.

| විෂය අංකය | අත්තිකාරම් ගිණුම් කටයුත්ත | මුල්‍ය ප්‍රතිඵල | | | |
|---|---|---|---|---|---|
| | | 2014 | | 2013 | |
| | | ලාභය කල්පිත ගාස්තු රහිතව | පාඩුව කල්පිත ගාස්තු සහිතව | ලාභය කල්පිත ගාස්තු රහිතව | ලාභය කල්පිත ගාස්තු සහිතව |
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 21302 | පොත් මුද්‍රණය, ප්‍රචාරණය හා අලෙවිය | 262.6 | (665.7) | 1,394.7 | 433.0 |

## 2.4 අග්‍රිම ගිණුම්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු 02 ක 2014 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂ එකතුව රු.මිලියන 124.3 ක් විය. විස්තර පහත දැක්වේ

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | අග්‍රිම ගිණුම් අංකය | 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු.මිලියන |
| අධ්‍යාපන අමාත්‍යාංශය | 7002/0000/00/0254/0014/000 | 2.0 |
| අධ්‍යාපන අමාත්‍යාංශය | 7003/0000/00/0013/0014/000 | 0.4 |
| විභාග දෙපාර්තමේන්තුව | 7002/0000/00/0055/0014/000 | 22.8 |
| අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව | 7002/0000/00/0172/0014/000 | 99.1 |
| **එකතුව** | | **124.3** |

## 2.5 පොදු තැන්පත් ගිණුම්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු 02 ක 2014 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.මිලියන 929.9 ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | තැන්පත් ගිණුම් අංකය | 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය |
| --- | --- | --- |
| | | රු.මිලියන |
| අධ්‍යාපන අමාත්‍යාංශය | 6000/0000/00/0006/0064/000 | 0.3 |
| අධ්‍යාපන අමාත්‍යාංශය | 6000/0000/00/0015/0039/000 | 833.2 |
| අධ්‍යාපන අමාත්‍යාංශය | 6000/0000/00/0015/0177/000 | 0.2 |
| විභාග දෙපාර්තමේන්තුව | 6000/0000/00/0006/0066/000 | 3.9 |
| විභාග දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0094/000 | 84.3 |
| අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0095/000 | 8.0 |
| **එකතුව** | | **929.9** |

**2.6 විගණන නිරීක්ෂණය**

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා හා පොත් අනුව අධ්‍යාපන අමාත්‍යාංශයේ හා ඒ යටතේ වන දෙපාර්තමේන්තුවල විසර්ජන ගිණුම්, ආදායම් ගිණුම, වාණිජ අත්තිකාරම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවල සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවල ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ සිට 5 ඡේදය දක්වා වූ ඡේදවල සඳහන් කර ඇත.

**3. ශීර්ෂ 126 - අධ්‍යාපන අමාත්‍යාංශය**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
| --- | --- |
| ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |

| | |
|---|---|
| පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑ්අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) |
| බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 |
| වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය | මුදල් රෙගුලාසි 1647(ඉ) |

**3.2 විගණන සාක්ෂි නොවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නිකුත් කර තිබුණු නියෝග මත, පන්තියකට ඇතුළත් කළ යුතු ළමුන්ගේ උපරිම සීමාව ඉක්මවා ජාතික පාසැල් 20 ක් වෙත පළමු ශ්‍රේණිය හා අතර මැදි පන්ති සඳහා 2013, 2014 හා 2015 යන වර්ෂවලදී පිළිවෙලින් ළමුන් 5,191 ක්, 3,714 ක් හා 424 ක් ඇතුළත් කර තිබුණි. එම ළමුන් ඇතුළත් කිරීම් චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව සිදු කරන ලද ඒවාද යන්න පරීක්ෂා කිරීම සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි ඇතුළත් ලිපි ගොනු විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

(ආ) ජාතික පාසැල් 63 ක් වෙතින් කැඳවන ලද, 2014 වාර්ෂික විගණනය සඳහා අවශ්‍ය වූ තොරතුරු 2015 අගෝස්තු 14 දින වන විටත් ඉදිරිපත් නොකෙරුණි.

**3.3 විගණන විමසුම්වලට පිළිතුරු දීම**

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 26 කට අදාලව 2015 සැප්තැම්බර් 14 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාළ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.3,940,046 ක් විය.

**3.4 විධිමත් නොවූ ගෙවීම්**

2014 වර්ෂයේදී ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් අමාත්‍යාංශයට රු.3,000,000 කට හෝ ඊට අඩු වටිනාකමකට වාහනයක් මිලදී ගැනීම අනුමත කර තිබුණි. අමාත්‍යාංශය විසින් මේ සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපාදන සළසා ගත යුතු වුවත්, එසේ නොකර හා ජාතික අයවැය දෙපාර්තමේන්තුව පනවා තිබුණු මූල්‍ය සීමාව ඉක්මවා රු.3,187,991 කට වාහනයක් ආනයනය කිරීම සඳහා ස්ථාවර නියෝගයක් මත බැංකු ගිණුමෙන් මුදල් වැය කර තිබුණි. මෙම ගෙවීම විධිමත් පරිදි ගිණුම්ගත නොකිරීම නිසා 2014 වර්ෂයේ පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශවල හඳුනානොගත් ගෙවීම් යටතේ ගැලපීම් කර තිබුණි.

**3.5 විසර්ජන ගිණුම**

**-----------------**

**අයවැය විචලනය**

**--------------------**

කාලීනව අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනීම, විධිමත්ව විදේශාධාර ලබා ගැනීමට කටයුතු නොකිරීම හා ප්‍රමාණවත් අග්‍රිම නොලැබීම වැනි කරුණු හේතුවෙන්, රු.376,445,247 ක්වූ මූලධන ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. එම ඉතිරිය තුළ ව්‍යාපෘති 06 ක් සඳහා සළසා තිබුණු රු.36,681,000 ක ප්‍රතිපාදන සම්පූර්ණයෙන් ඉතිරි වී තිබුණු අතර තවත් ව්‍යාපෘති 03 ක් සඳහා සළසා තිබුණු මූලධන ප්‍රතිපාදනවලින් රු.15,850,533 ක් ඉතිරි වී තිබුණු අතර එය සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 47 ක සිට 83 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

**3.6 අග්‍රිම ගිණුම්**

**------------**

මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව කාර්ය නිමකළ වහාම ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කළ යුතු වුවත්, ජාතික පාසැල් 14 ක් විසින් අවස්ථා 133 කට අදාළව ලබාදී තිබුණු එකතුව රු.1,971,208 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම 2014 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

**3.7 පොදු තැන්පත් ගිණුම**

**---------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** අමාත්‍යාංශය විසින් පවත්වා තිබුණු තැන්පත් ගිණුම් තුනක 2014 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.833,611,495ක් විය. එම ගිණුම් 03 ට අදාළ එකතුව රු.52,231,015 ක්වූ කල් ඉකුත්වූ තැන්පත් ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**(ආ)** 2010 මැයි 25 දිනැති අංක 4/2010 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව, 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ අනියම් සේවකයින්ගේ වැටුප්වලින් අවකරණ කළ රු.664,565 ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල වෙත ප්‍රේෂණය කර නොතිබුණි. එම මුදල් ඒ ඒ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවල, කළාප අධ්‍යාපන කාර්යාලවල සහ අධ්‍යාපන විද්‍යාපීඨවල පොදු තැන්පත් ගිණුම්වල රඳවාගෙන තිබුණි.

**(ඇ)** 2006 ජුනි 20 දිනැති අංක 2006/27 දරන අධ්‍යාපන අමාත්‍යාංශයේ චක්‍රලේඛයේ 8.2.2 ඡේදය ප්‍රකාරව 5 වන ශ්‍රේණියේ ශිෂ්‍යත්වධාරීන්ට ගෙවීම සඳහා මාස් පතා එවනු ලබන ශිෂ්‍යාධාර අදාළ කළාප අධ්‍යාපන කාර්යාලය වෙත ලැබුණු පසු එම මාසයේ 25 දිනට පෙර අදාළ සිසුන්ගේ බැංකු ගිණුම්වල තැන්පත් කළ යුතුව තිබුණි. 2009

වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී කළාප අධ්‍යාපන කාර්යාල වෙත ලැබී තිබුණු එකතුව රු.1,734,235 ක ශිෂ්‍යාධාර, ශිෂ්‍යත්වලාභීන්ගේ ගිණුම්වල තැන්පත් නොකර ඒ ඒ කළාප අධ්‍යාපන කාර්යාලවල පොදු තැන්පත් ගිණුම්වල රඳවාගෙන තිබුණි.

## 3.8 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 12601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරික්ෂාවේදි පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට වූ හර ශේෂය තුළ, එකතුව රු.4,303,692 ක ගිණුම්කරණ දෝෂ නිසා උද්ගතවූ ශේෂයක් විය. ඉන් එකතුව රු.2,048,694 ක් වර්ෂ 5 කට වැඩි කාලයක සිටද, එකතුව රු.2,254,998 ක් වර්ෂ 1 ක සිට වර්ෂ 5 ක් අතර කාල පරාසයක සිටද පැවත එමින් තිබුණි. 2014 දෙසැම්බර් 31 දින වන විටත් එම දෝෂ හඳුනාගෙන නිවැරදි කිරිමට අමාත්‍යාංශය අපොහොසත්වී තිබුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව හා පාලන ගිණුමේ ශේෂය අතර රු.2,602,735 ක හඳුනා නොගත් වෙනසක් පැවැතුණි.

(ඇ) 2014 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව, වර්ෂ 5කට වඩා වැඩි කාලයක සිට අයවීම් සම්පූර්ණයෙන් හිඟහිට තිබුණු ණය ශේෂවල එකතුව රු.127,929,636 ක් වි තිබුණි. එම හිඟහිටි ණයශේෂ අයකර ගැනීමට ප්‍රමාණවත් හා විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. ඒ අතර රු.128,150 ක් වූ දේපල ණය ශේෂයට අදාළ ඇප ඔප්පුව කෙරෙහි අවධානය යොමු කර එම ණය ශේෂය අයකර ගැනිමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි. තවද ඒ අතර වූ ස්ථාන මාරුවී ගිය නිලධාරීන් 22 දෙනෙකුගේ, විශ්‍රාම ගිය නිලධාරීන් 14 දෙනෙකුගේ සහ වැඩ තහනම් කළ හා සේවය හැර ගිය නිලධාරීන් 19 දෙනෙකුගේ එකතුව රු.2,180,908 ක ණය ශේෂ සම්බන්ධයෙන් තොරතුරු කිසිවක් අමාත්‍යාංශයේ නොතිබීම නිසා එම ණය අය කර ගැනීමට නොහැකි වී තිබුණි.

**3.9 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**-------------------------------------**

**අභ්‍යන්තර විගණනය**

-------------------------

2014 වර්ෂයේදී ක්‍රියාත්මක කර තිබුණු විදේශ ණය හා ආධාර ව්‍යාපෘති 03 ක රු.මිලියන 6,225 ක ගනුදෙනු සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

**3.10 වත්කම් කළමනාකරණය**

**-------------------------**

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

**---------------------------------------**

අමාත්‍යාංශය සතු මෝටර් වාහන 20 ක් හා යතුරු පැදි 02 ක් වර්ෂ 3 කට වැඩි කාලයක සිට නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවැතුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

**--------------------------------------**

2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2014 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2015 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, අමාත්‍යාංශය 2015 මැයි 31 දින වන විටත් ජාතික පාසැල් 146 ක හා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ 03 කට අදාළ එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2013 වර්ෂය වෙනුවෙන් පවත්වා තිබුණි.

**(ඇ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

**---------------------------------------**

අමාත්‍යාංශය විසින් පවත්වා තිබුණු ස්ථාවර වත්කම් ලේඛනයට අනුව, අමාත්‍යාංශය සතුව තිබුණු වාහන 04 ක් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය, ජාතික අධ්‍යාපන ආයතනය හා නායකත්ව සංවර්ධන මධ්‍යස්ථානය වෙත මුදාහැර තිබුණු නමුත් වාහනවල අයිතිය එම ආයතන වෙත පවරා ස්ථාවර වත්කම් ලේඛනයෙන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

**(ඈ) පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම**

**-----------------------------------------------------**

ආරක්ෂක සේවා විද්‍යාලයට අවශ්‍ය ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා 2008 වර්ෂයේ සිට අධ්‍යාපන අමාත්‍යාංශය වෙත සළසා තිබුණු රු.1,191,970,840 ක ප්‍රතිපාදන

උපයෝගීකර ගනිමින් රු.1,098,236,071 ක් වැය කරමින් නාගරික සංවර්ධන අධිකාරිය සතු හෙක්ටයාර් 1.9329 ක් වූ භූමියෙහි ගොඩනැගිලි ඉදිකර තිබුණු නමුත් භූමියේ නෛතික අයිතිය අධ්‍යාපන අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3.11 අනුකූල නොවීම්

### (අ) නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | |
| • ආයතන සංග්‍රහයේ VII වැනි පරිච්ඡේදයේ 1.6 වගන්තිය | - | 2014 වර්ෂයේදී හා ඊට පෙර කාලය තුළදී ජාතික පාසල් 151 ක අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 724 දෙනෙකු දින 12,093 ක් වැටුප් රහිත නිවාඩු ලබා ගෙන තිබුණි. එම කාලයට අදාල වැටුප් එම නිලධාරීන්ගෙන් අය කර ගැනීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි. |
| • ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 1 වගන්තිය | - | ආයතන සංග්‍රහය ප්‍රකාරව නිවාඩු සඳහා විධිමත් අනුමැතියක් ලබා ගත යුතු නමුත්, ඊට අනුකූල නොවන පරිදි 2014 වර්ෂයේදී හා ඊට පෙර කාලය තුළදී ජාතික පාසැල් 42 ක අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 348 දෙනෙකු විසින් ලබා ගෙන තිබුණු මුළු නිවාඩු දින ගණන 5,744 ක් විය. |

| | | |
|---|---|---|
| • ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 5 වගන්තිය | | ගුරු විද්‍යාල 02 ක නිල නිවාසවල පදිංචිව සිටින නිලධාරීන් 04 දෙනෙකුගෙන් ජල හා විදුලි ගාස්තු අය කර නොතිබුණු අතර ගුරු විද්‍යාලයක සේවය කරන අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෙකු නිල නිවාස නොවන එහෙත් පරිශ්‍රයේ වෙනත් ගොඩනැගිල්ලක පදිංචිවී සිටින නමුත් අවම වශයෙන් ජලය හා විදුලිය පරිභෝජනය සඳහා කිසිදු මුදලක් අයකර නොතිබුණි. විද්‍යා පීඨයක හා ගුරු විද්‍යාලයක නිල නිවාස 02 ක් භාවිතයෙන් තොරව පවතින බවත්, විද්‍යාපීඨ 04 ක හා ගුරු විද්‍යාල 03 ක නිල නිවාස 08 ක් අලුත්වැඩියා නොකිරීම හේතුවෙන් භාවිතයට ගත නොහැකිව පවතින බවත් අනාවරණය විය. |
| **(ii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** ---------------------------------- | | |
| • මුදල් රෙගුලාසි 94 | 3,943,592,358 | වාර්ෂික පුනරාවර්තන සැපයුම් හා අවිච්ඡේද වැඩ සඳහා බැඳීම් හැරුණු කොට සමාලෝචිත වර්ෂය සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනයන් කළ පසු ඉතිරිය ඉක්මවා බැඳීම්වලට එළඹ තිබුණි. |
| • මුදල් රෙගුලාසි 104 හා 109 | 7,382,351 | 2014 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 01 සිට වර්ෂ 15 දක්වා කාල පරාසය තුළදී අවස්ථා 66 කදී සිදු වී තිබුණු හානි හා පාඩු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව ප්‍රාරම්භක පරික්ෂණ වාර්තා හා පූර්ණ වාර්තා පිළියෙල කර නොතිබුණි. රු.50,000 කට වඩා වැඩි හානි හා පාඩු පිළිබඳව භාණ්ඩාගාරය වෙත වාර්තා කිරීමට කටයුතු කර නොතිබුණු අවස්ථා අනාවරණය විය. |

**(iii) අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ චක්‍රලේඛ**

--------------------------------

| | | |
|---|---|---|
| • 1961 නොවැම්බර් 20 දිනැති අංක 1961/27 දරන හා 1964 නොවැම්බර් 20 දිනැති අංක 1964/27 දරන චක්‍රලේඛ හා 1995 ජුනි 21 දිනැති අමාත්‍යාංශයේ ලේකම්ගේ ලිපිය | - | විදුහල්පති නිල බලයෙන් ආදි ශිෂ්‍ය සංගමයේ සභාපති විය යුතු නමුත් ජාතික පාසැල් 16 ක ආදි ශිෂ්‍ය සංගමයේ සභාපති ධූරයට විදුහල්පති පත් නොකර ආදි ශිෂ්‍ය සංගම් සාමාජිකයින් එම තනතුරට පත්කර තිබුණි. මෙම පාසල් අතරින් බොහෝ පාසැල්වලට අයත් ගොඩනැගිලි ආදි ශිෂ්‍ය සංගම් විසින් අත්පත්කර ගැනීම මෙන්ම පාසැල් සංවර්ධන සමිතියට බැර කළ යුතු ප්‍රචාරණ දැන්වීම් පුවරු ආදායම් එම ශිෂ්‍ය සංගම් ගිණුම්වලට බැර කර තිබුණු බව අනාවරණය විය. |
| • 2007 දෙසැම්බර් 31 දිනැති අංක 2007/20 දරන චක්‍රලේඛය | - | චක්‍රලේඛ විධිවිධාන නිසි ලෙස ක්‍රියාත්මක කර නොතිබීම නිසා ජාතික පාසැල් 200 ක ගුරුභවතුන් 4,268 දෙනෙකු වර්ෂ 12 ක සිට වර්ෂ 35 ක් දක්වා කාල පරාසය තුළ ස්ථාන මාරුවීම් නොලබා එකම පාසලක සේවයේ යොදවා තිබුණි. |
| • 2008 සැප්තැම්බර් 19 දිනැති අංක 2008/38 දරන චක්‍රලේඛය | - | ඌව පළාතේ ජාතික පාසැලක විදුහල්පතිවරයෙකු විසින් 2014 වර්ෂයේදී 6 ශ්‍රේණියේ සිට 12 ශ්‍රේණිය දක්වා වූ ශ්‍රේණි 07 ක් සඳහා චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව, අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව, ළමුන් 75 දෙනෙකු ඇතුළත් කර තිබුණි. |
| • 2012 නොවැම්බර් 23 දිනැති අංක 42/2012 දරන චක්‍රලේඛය | - | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව, විශේෂ අධ්‍යාපන විෂය ක්ෂේත්‍රය සඳහා බඳවාගත් ගුරුභවතුන් එම ක්ෂේත්‍රයේම සේවයේ යෙදවිය යුතු වුවත්, ඊට අනුකූල නොවන පරිදි විශේෂ අධ්‍යාපන ඒකක රහිත ජාතික පාසැල් 72 ක් වෙත |

විශේෂ අධ්‍යාපන පුහුණු ගුරුභවතුන් 118 ක් අනුයුක්ත කර තිබුණි. විශේෂ අධ්‍යාපන ඒකක සහිත ජාතික පාසල් 40 කට අනුයුක්ත කර තිබුණු පුහුණු ගුරුභවතුන් 58 ක් සාමාන්‍ය සිසුන් සඳහා වූ පන්තිවල ඉගැන්වීම් සඳහා යොදවා තිබුණි.

- 2013 මැයි 23 දිනැති අංක 23/2013 දරන චක්‍රලේඛය - චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවන පරිදි ලකුණු ලබා දෙමින්, පළමු ශ්‍රේණිය සඳහා ශිෂ්‍යයින් 32 දෙනෙකු මාතර ජාතික පාසැල් දෙකකට ඇතුළත් කර තිබුණි.

- 2013 මැයි 23 දිනැති අංක 23/2013 දරන චක්‍රලේඛය හා 2008 සැප්තැම්බර් 19 දිනැති අංක 2008/37 දරන චක්‍රලේඛය - 2013, 2014 හා 2015 යන වර්ෂවලදී ජාතික පාසලක ප්‍රාථමික ශ්‍රේණිවල සමාන්තර පන්තියක සිටිය යුතු උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව 40 ක් හා ද්විතීක ශ්‍රේණිවල සමාන්තර පන්තියක සිටිය යුතු උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව 45 ක් යන සීමාවන් ඉක්මවා, ජනප්‍රිය ජාතික පාසල් 20 කට ඇතුළත් කරගෙන තිබුණු මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 9,329 ක් විය. චක්‍රලේඛ විධිවිධාන උල්ලංඝනය කරමින් දරුවන් පාසල්වලට ඇතුළත් කිරීම හේතුවෙන් සමහර දරුවන්ට අසාධාරණයක් සිදුවී තිබුණි.

- 2013 නොවැම්බර් 07 දිනැති අංක 2003/38 දරන චක්‍රලේඛය - නවක ගුරුවරු ජාතික පාසල්වලට අනුයුක්ත කිරීමේදී නිසි ප්‍රතිපත්තියකට අනුව කටයුතු නොකර තිබුණු අතර ගුරුමාරු ප්‍රතිපත්තිය නිසි පරිදි ක්‍රියාත්මක කර නොතිබුණි. මේ නිසා චක්‍රලේඛයේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව හඳුනාගෙන තිබුණු, 2014 දෙසැම්බර් 31 දිනට

ජාතික පාසල් 193 ක පවතින ගුරු ඌනතා 2,248 ක් හා ජාතික පාසල් 163 ක ගුරු අතිරික්තතා 1,387 ක් අවම කර ගැනීමට කටයුතු කර නොතිබුණි. ඒ අතරින් එදින වන විට මාතර වැලිගම ජාතික පාසලක උසස් පෙළ භූගෝලය, බෞද්ධ සංස්කෘතිය, ඉංග්‍රීසි හා තාක්ෂණ විෂයයන් ඉගැන්වීමට එකම ගුරුභවතෙකු හෝ නොවීය.

| | | |
|---|---|---|
| • 2013 නොවැම්බර් 07 දිනැති අංක 2003/38 දරන චක්‍රලේඛය | - | චක්‍රලේඛයේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව, ජාතික පාසලක නියෝජ්‍ය විදුහල්පතිවරුන් වෙත සතියකට කාල පරිච්ඡේද 10 ක් සහ සහකාර විදුහල්පතිවරුන් වෙත සතියකට කාල පරිච්ඡේද 12 ක් ඉගැන්වීම් කටයුතු පැවරිය යුතු විය. නමුත් ජාතික පාසල් 64 ක නියෝජ්‍ය විදුහල්පතිවරුන් 121 දෙනෙකු වෙත සහ ජාතික පාසල් 28 ක සහකාර විදුහල්පතිවරුන් 61 දෙනෙකු වෙත එකම කාල පරිච්ඡේදයක් හෝ ඉගැන්වීම් කටයුතු පවරා නොතිබුණි. ජාතික පාසල් 14 ක නියෝජ්‍ය විදුහල්පතිවරුන් 20 දෙනෙකු වෙත සහ ජාතික පාසල් 04 ක සහකාර විදුහල්පතිවරුන් 06 දෙනෙකු වෙත සතියකට 02 ක සිට 06 ක් දක්වා පරාසයක ප්‍රමාණයක කාලපරිච්ඡේද සංඛ්‍යාව ක් ලබා දී තිබුණි. |
| • 2013 නොවැම්බර් 07 දිනැති අංක 2003/38 දරන චක්‍රලේඛය | - | චක්‍රලේඛයේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව, විෂයය ඉගැන්වීමේ නියුතු ගුරුභවතුන් පිළිවෙලින් සතියකට අවම වශයෙන් විනාඩි 40 කාලපරිච්ඡේද 35 ක් ඉගැන්වීමේ කාර්යයෙහි නියුක්ත විය යුතු වුවද, ජාතික පාසැල් 39 ක ගුරුභවතුන් 160 දෙනෙකු වෙත එකම ඉගැන්වීම් කාලපරිච්ඡේදයක් හෝ ලබාදී |

නොතිබුණි. තවත් ජාතික පාසැල් 147 ක ගුරුභවතුන් 1,390 දෙනෙකු වෙත ඉගැන්වීම් කාලපරිච්ඡේද 20 කට වඩා අඩු සංඛ්‍යාවක් ලබාදී තිබුණි.

**(ආ) බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම**

---

මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර 860 ක් ඉදිකිරීමේ කටයුතු කරනු ලබන කොන්ත්‍රාත්කරුවන් වෙත 2012, 2013 හා 2014 වර්ෂවලදී රු.913,161,535 ක්ද, මහින්දෝදය තාක්ෂණික විද්‍යාපීඨ 250 ක ඉදිකිරීමේ කටයුතු කරනු ලබන කොන්ත්‍රාත්කරුවන් වෙත 2014 වර්ෂයේදී රු.818,042,809 ක්ද වශයෙන් එකතුව රු.1,731,204,344 ක එකතු කළ අගය මත බදු ගෙවා තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.12 මාර්ගෝපදේශයේ විධිවිධාන ප්‍රකාරව එම විස්තර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත හා විගණකාධිපතිවරයා වෙත දැනුම් දී නොතිබුණි.

**3.12 විදේශාධාර ව්‍යාපෘති හා වැඩසටහන්**

---

සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් විදේශ මුල්‍යකරණය යටතේ ව්‍යාපෘති 02 ක් හා වැඩසටහනක් ක්‍රියාත්මක කර තිබුණි. විදේශ ණය හා ප්‍රදාන ගිවිසුම් අනුව, ඒවායේ ඇස්තමේන්තුගත පිරිවැයවල එකතුව රු.මිලියන 42,967 ක් වී තිබුණු අතර එම ව්‍යාපෘති වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 6,225 ක් උපයෝජනය කර තිබුණි. මෙම විදේශාධාර ව්‍යාපෘති සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන**

---

ඉහත වැඩසටහනට අදාල ගනුදෙනු සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) වැඩසටහන සඳහා අනුමත කළ ණය මුදලින් 2014 වර්ෂයේදී ඇමරිකානු ඩොලර් මිලියන 33.32 ක් මහා භාණ්ඩාගාරය විසින් ලබාගෙන තිබුණු නමුත්, ඉන් ඇමරිකානු ඩොලර් මිලියන 23.7 කට සමාන අග්‍රිම මුදල් පමණක් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත එවා තිබුණි.

(ii) 2013 වර්ෂයේදී අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා අළුතින් හඳුන්වා දුන් තාක්ෂණවේදය විෂයධාරාව වෙනුවෙන් මහින්දෝදය තාක්ෂණික විද්‍යාපීඨ 250 ක් ඉදිකිරීම සඳහා රු.7,000,000,000 ක්වූ මුළු පිරිවැය

ඇස්තමේන්තුව අනුමත කර තිබුණි. 2014 දෙසැම්බර් 31 දින වන විට ඉන් රු.2,791,049,122 ක් වැය කර විද්‍යාපීඨ 02 ක් පමණක් සම්පූර්ණයෙන් නිම කර තිබුණි. ඉතිරි විද්‍යාපීඨ 248 ක් අර්ධ වශයෙන් නිමකර තිබුණි.

(iii) අර්ධ වශයෙන් නිම කළ විද්‍යාපීඨයක ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු විසින් ගිවිසුම් කඩකිරීම හේතුවෙන් ගිවිසුම් අවසන් කර (terminate) තිබුණු නමුත්, 2015 ජුනි 30 දින වන විටත් අත්තිකාරම් හා කාර්යසාධන ඇප බැඳුම්කරවලින් රු.5,794,500 ක් මුදල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iv) විද්‍යාපීඨ ඉදිකර අවසන් කිරීමට ප්‍රථම, 2014 වර්ෂයේදී ඒකාබද්ධ අරමුදලින් හා "දැනුමැති සමාජයක් සඳහා වූ අධ්‍යාපනය" ව්‍යාපෘතියෙන් රු.970,286,092 ක් වැයකර විද්‍යාපීඨ 250 ක් සඳහා ලී බඩු හා අදාළ තාක්ෂණික උපකරණ මිලදී ගෙන තිබුණු බැවින් වර්ෂයකට වඩා වැඩි කාලයක් එම වත්කම් නිෂ්ක්‍රීයව තබා තිබුණු අතර වගකීම් සහතික කල් ඉකුත්වී තිබුණි.

(v) අවශ්‍ය භෞතික හා මානව සම්පත් සහ අදාළ යටිතල පහසුකම් ලබා නොදී තාක්ෂණවේදය විෂයධාරාව සඳහා ශිෂ්‍යයින් බඳවා ගෙන තිබුණි. එම හේතුවෙන් විෂය නිර්දේශයෙන් සියයට 15 ක් වූ ප්‍රායෝගික පුහුණුවීම් ලබාදීමට නොහැකි වූ සිසුන් 2015 අගෝස්තු මාසයේදී පැවැත්වීමට නියමිත උසස් පෙළ විභාගයට ඉදිරිපත් කිරීමට සිදු වී තිබුණි. පාසල් 13 ක එම විෂයධාරාව හැදෑරීම සඳහා එකම ශිෂ්‍යයෙකු හෝ ඉදිරිපත් වී නොතිබුණු අතර, තවත් පාසල් 20 ත් 62 ත් අතර ප්‍රමාණයක මෙම විෂයධාරාව හදාරන ශිෂ්‍යයින් සංඛ්‍යාව 1 ත් 9 ත් අතර ඉතා අඩු ප්‍රමාණයක් වී තිබුණි. එකිනෙක විෂයයන් සඳහා සමස්ථ ගුරු ඌනතාවය 165 ක් වී තිබුණි.

(vi) අදාළ පාසලේ මූල්‍ය ප්‍රතිපාදන මගින් විද්‍යාපීඨය ඉදිකිරීමේ හා අවශ්‍ය උපකරණ මිලදී ගැනීමේ කොන්දේසියට යටත්ව, කොළඹ සහ කෑගල්ල පිහිටි ජාතික පාසල් දෙකට තාක්ෂණික විෂය ධාරාව ඉගැන්වීමට අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ලබාදී තිබුණු අනුමැතියක් මත සිසු දරුවන් 300 කට අධික සංඛ්‍යාවක් ඇතුළත් කර ගෙන තිබුණි. නමුත් 2015 ජූලි 10 දින වන විටත් එම ඉදිකිරීම් හෝ උපකරණ මිලදී ගැනීම් හෝ සිදුකර නොතිබුණි.

(vii) මහින්දෝදය තාක්ෂණ විද්‍යාපීඨ 100 ක් සඳහා රු.9,284,240 ක් වැය කර සිවිල් ඉංජිනේරු උපකරණ හා විදුලි උපකරණ මිලදී ගෙන තිබුණි. එම මිලදී ගැනීම සඳහා උපකරණ අයිතම එකිනෙක සඳහා ලැබී තිබුණු ලංසු ඇගයීමට කටයුතු නොකර, එකිනෙක කාණ්ඩය සඳහා ලංසු කැඳවමින් මිලදී ගෙන තිබීම හේතුවෙන් රු.2,550,512 ක පාඩුවක් සිදුවී තිබුණි.

(viii) වැඩසටහනේ ප්‍රතිපාදන නිකුතු හා බැඳුනු දර්ශකවල ඇතුළත් නොවූ වැඩසටහනක් වෙනුවෙන් රු.3,845,400 ක් වැයකර තිබුණු අතර ඉන් රු.2,052,000 ක් සංග්‍රහ වියදම් වූ අතර රු.481,000 ක් අනවශ්‍ය ප්‍රචාරණ වියදම් විය. මෙම වැඩසටහනේ ප්‍රගතිය පිළිබඳ පසුවිපරම් කිරීමක්ද සිදුකර නොතිබුණි.

(ix) වැඩසටහනේ ප්‍රතිපාදන නිකුතු හා බැඳුනු දර්ශකයකට අදාළ නොවන කටයුත්තක් වූ, කළාපීය තොරතුරු තාක්ෂණ සන්නිවේදන මධ්‍යස්ථාන 77 ක් මගින්, ජාත්‍යන්තර පරිගණක ධාවන බලපත්‍රය සහ ජාත්‍යන්තර තොරතුරු සන්නිවේදන තාක්ෂණ සහතිකය යන පාඨමාලා දෙක පැවැත්වීමට කටයුතු කර තිබුණි. එම පාඨමාලා දෙකෙහි දේශීය නියෝජිතත්වය දරන පෞද්ගලික ආයතන දෙකක එම පාඨමාලා දෙක පැවැත්වීම සඳහා ලියාපදිංචි කිරීමට සමාලෝචිත වර්ෂයේදී රු.3,487,000 ක් වැයකර තිබුණි. නමුත් 2015 ජුනි 20 දින වන විටත් ලියාපදිංචි සහතික ලබාගැනීමට, ලියාපදිංචියේ වලංගු කාලය නිර්නය කර ගැනීමට හා එම පාඨමාලා පැවැත්වීම සඳහා නිර්නායකයන් හඳුනාගැනීමට හෝ කටයුතු කර නොතිබුණි. පරිගණක, දෘඩාංග, මෘදුකාංග, අන්තර්ජාල පහසුකම්, මානව සහ වෙනත් පහසුකම් සපයා නොතිබීම වැනි කරුණු හේතුවෙන් එකම පාඨමාලාවක් හෝ සමාලෝචිත වර්ෂයේදී පවත්වා නොතිබුණි.

(x) උසස් පෙළ තාක්ෂණ විෂය ධාරාව හැදෑරීමට පෙළඹවීම හා දිරිමත් කිරීමට ප්‍රජාව දැනුවත් කිරීමේ දර්ශකය, වැඩසටහනේ ප්‍රතිපාදන නිකුතු හා බැඳුනු දර්ශකවල ඇතුළත් කර තිබුණි. මේ සඳහා විනිවිදභාවයකින් යුත් ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් තොරව සමාලෝචිත වර්ෂයේදී රු.13,800,000 ක් වැයකර, පිටපත් 100,000 කින් සමන්විත පොතක් මුද්‍රණය කර තිබුණි. උසස් පෙළ තාක්ෂණ විෂයධාරාව හැදෑරීමට දරුවන් හා දෙමාපියන් පෙළඹවීමට අදාළ ප්‍රමාණවත් කරුණු මෙම පොතට ඇතුළත් කර නොතිබුණි. මෙම පොත් පිටපත් 100,000 ක් ගබඩාව වෙත ලබාදීමකින් තොරව, ප්‍රතිපත්ති හා කාර්යසාධන සමාලෝචන අංශය විසින් භාර ගෙන තිබුණු බවට සටහන් යොදා තිබුණු නමුත්, බෙදාහැරීම තහවුරු කිරීම තහවුරු වන කිසිඳු ලිඛිත සාක්ෂියක් පවත්වා නොතිබුණි.

(xi) වැඩසටහනේ ප්‍රතිපාදන නිකුතු හා බැඳුනු දර්ශකවල ඇතුළත් නොවන හා ප්‍රචාරණයක් සිදුකිරීමේ අවශ්‍යතාවයක් ඇති නොවන කාර්යයක් වූ, ගුරු විදුහල්පති නව සේවා ව්‍යවස්ථා පිළිබඳව ගුරුභවතුන් දැනුවත් කිරීම සඳහා පුවත්පත් දැන්වීම් පල කිරීමට සමාලෝචිත වර්ෂයේදී රු.2,507,722 ක් වැයකර තිබුණි.

(ආ) **දැනුමැති සමාජයක් සඳහා වූ අධ්‍යාපනය ව්‍යාපෘතිය**

යෝජිත ව්‍යාපෘති අරමුදලින් සිදුකර තිබුණු ගනුදෙනු සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) පාසල්, කොට්ඨාශ, කළාප, පළාත් හා අමාත්‍යාංශයේ මට්ටමේ සියළුම අධ්‍යාපන ආයතනවල, මානව සම්පත්, භෞතික සම්පත් හා මූල්‍ය කටයුතුවලට අදාළ තොරතුරු මෙන්ම, අන්තර්ජාලය හරහා සෘජුවම ගුරුවරයාගේ පෞද්ගලික ලිපිගොනුව හා සම්බන්ධ රාජකාරී ඉටුකර ගැනීමටද, ගුරුභවතුන්ට තමන්ගේ තොරතුරු පරීක්ෂා කිරීම, නව තොරතුරු ඇතුළත් කිරීම, ස්ථාන මාරුවීම් හා පුහුණු අවස්ථා සඳහා අයදුම් කිරීම, අමාත්‍යාංශයට අවශ්‍ය සංඛ්‍යාත්මක වාර්තා ලබාගැනීම ආදී වූ විවිධ අරමුණු ඉටුකර ගැනීමට අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා 2011 වර්ෂයේ සිට 2014 දෙසැම්බර් 31 දින දක්වා වූ කාලය තුළදී රු.64,060,373 ක් වැය කර තිබුණි. වියදමේ ඵලදායිකත්වයක් හා කාර්යසාධනයක් නොමැති බවත්, මේ සම්බන්ධයෙන් වූ අරමුණු ළඟා කර ගැනීමට නොහැකිවී තිබුණු බවත් අනාවරණය විය.

(ii) මහින්දෝදය තාක්ෂණ විද්‍යාගාර විවෘත කිරීමේ උත්සවවලට පෙර අදාළ පාසල්වල අලංකාර කටයුතු සඳහා පාසල් 37 ක් වෙත නිකුත් කර තිබුණු රු.10,900,000 ක අත්තිකාරම් 2014 දෙසැම්බර් 31 දින වන විට කාර්ය මණ්ඩල පුහුණු වැය විෂයයට හර කරමින් පියවා තිබුණි. අත්තිකාරම් පියවීම සඳහා බිල්පත් හා ලදුපත් සහිත විධිමත් වවුචරයක් පිළියෙල කර නොතිබුණි.

(iii) පාසල් හා අධ්‍යාපන ආයතන 1,724 ක් වෙත ලබාදී තිබුණු පාසල් පරිගණක ජාලයේ මෙහෙයුම් කටයුතු, උපකරණ සැපයීම හා දුරකථන බිල්පත් පියවීම වෙනුවෙන්, 2008 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලය තුළදී ව්‍යාපෘති අරමුදලින් රු.294,347,823 ක්ද, ඒකාබද්ධ අමුදලින් රු.540,993,862 ක්ද වැයකර තිබුණි. පාසැල් පරිගණක ජාලයට අදාළ මාසික දූරකථන බිල්පත් පියවීමට ප්‍රථම, එහි කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය පිළිබඳ නිර්දේශ ලබාගැනීමකින් තොරව හා බිල්පත් අදාළවන පාසල හෝ ආයතනය හඳුනාගැනීමකින් තොරව, 2011, 2012, 2013 හා 2014 වර්ෂවලදී පමණක් රු.813,905,729 ක දුරකතන බිල්පත් පියවා තිබුණි. පාසල් පරිගණක ජාලය මන්දගාමී වීම, බොහෝ අවස්ථාවලදී සම්බන්ධතා විදාන සංඥා (signal) නොමැතිවීම ආදී වූ විවිධ හේතු රාශියක් නිසා බොහෝ පාසල් මෙය භාවිතයෙන් ඉවත් කර ඇති බව තහවුරු විය.

(iv) ව්‍යාපෘතියේ අරමුණක් වූ කාර්ය මණ්ඩල පුහුණු කිරීම් සඳහා වූ වැය විෂය යටතේ සැළසී තිබුණු ප්‍රතිපාදන උපයෝගී කරගෙන ව්‍යාපෘතියේ අරමුණුවලින් බැහැරවූ මහින්දෝදය තාක්ෂණ විද්‍යාගාර විවෘත කිරීමේ ප්‍රචාරණ දැන්වීම් පුවත්පත්වල පළකිරීම සඳහා රු.1,207,133 ක් වැය කර තිබුණි.

(v) අවශ්‍යතාවය පිළිබඳ පූර්ව හඳුනාගැනීමකින්ද, ගනුදෙනුව සඳහා බලය ලබා ගැනීමකින්ද හා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 9.4.1 මාර්ගෝපදේශය ප්‍රකාරව වෙනත් පොත් ප්‍රකාශකයින්ගෙන් පොත් පිළිබඳව විමසීමකින් තොරව, 2014 වර්ෂයේදී පුස්තකාල පොත් තොගයක් රු.3,891,003 ක් වැයකර එක් ප්‍රකාශකයකුගෙන් මිලදී ගෙන තිබුණි. ඒ සඳහා අවශ්‍යවන ප්‍රතිපාදන කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ වැය විෂයෙන් ලබා ගෙන තිබුණි. මෙම පොත් 2014 දෙසැම්බර් 16 දින සිට අධ්‍යාපන අමාත්‍යාංශයේ මධ්‍යම ගබඩාවේ රඳවාගෙන තිබුණද, 2015 ජූනි 09 දින වන විටත් එම පොත් පාසල් වෙත බෙදාහැරීමට කටයුතු කර නොතිබුණි.

**(ඇ) දැනුම් කේන්ද්‍රීය පදනම ලෙස පාසැල් අධ්‍යාපන පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය**

---

යථෝක්ත ව්‍යාපෘති අරමුදලින් සිදුකර තිබුණු ගනුදෙනු සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) 2012, 2013, හා 2014 යන වර්ෂ තුන වෙනුවෙන් අනුමත මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.1,545,356,146 ක් වුවද, 2014 දෙසැම්බර් 31 දිනට මුළු සත්‍ය වියදම රු.1,248,503,649 ක් වැනි අඩු මට්ටමක පැවතීම හේතුවෙන් ව්‍යාපෘතියේ අපේක්ෂිත මුළු කාර්යසාධනය ළඟාකර ගැනීමට අපොහොසත්වී තිබුණි.

(ii) මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ලෝක බැංකුව සමඟ එළඹ තිබුණු ණය ගිවිසුම ප්‍රකාරව, ලබාගත් ණය වෙනුවෙන් සියයට 1.25 ක පොළියක් ගෙවිය යුතුව තිබුණි. 2012 සැප්තැම්බර් 03 දින සිට 2013 අප්‍රේල් 09 දින දක්වා වූ මාස 07 කට අධික කාලයක් තුළ රු.35,954,362 ක්ද, 2013 අප්‍රේල් 10 දින සිට 2014 අප්‍රේල් 30 දින දක්වා වූ වර්ෂයකට අධික කාලයක් සඳහා රු.420,786,511 ක්ද, 2014 අප්‍රේල් 30 දින සිට 2014 දෙසැම්බර් 31 දින දක්වාවූ මාස නවයකට අධික කාලයක් සඳහා රු.26,714,875 ක්ද වශයෙන් බැංකු ජංගම ගිණුමක මුදල් ශේෂ නිෂ්ක්‍රීයව තබා තිබුණි.

(iii) 2014 වර්ෂයේදී ව්‍යාපෘතිය මගින් රු.47,915,633 ක්ද, දේශීය අරමුදල් වලින් රු.59,775,374 ක්ද වශයෙන් එකතුව රු.107,691,007 ක් වැය කර මහින්දෝදය තාක්ෂණ විද්‍යාගාර සඳහා විද්‍යා උපකරණ හා රසායනික ද්‍රව්‍ය වර්ග 586 ක් මිලදී ගෙන තිබුණි. එකිනෙක අයිතමය සඳහා වෙන වෙනම ලංසු ඇගයීමට කටයුතු නොකර කාණ්ඩ 11 කට වර්ග කර ලංසු කැඳවමින් ඇගයීම් කර මිලදී ගැනීමට කටයුතු කර තිබීම හේතුවෙන් රජයට රු.12,306,485 ක පාඩුවක් සිදු වී තිබුණි. .

(iv) 2014 වර්ෂයේදී ව්‍යාපෘතිය මගින් රු.41,283,609 වැය කර මහින්දෝදය තාක්ෂණ විද්‍යාගාර සඳහා ලී බඩු වර්ග 14 ක් මිලදී ගෙන තිබුණි. තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් අනුමත කර තිබුණු ඇගයීම් නිර්ණායක ප්‍රකාරව එකිනෙක ලී බඩු වර්ගය සඳහා වෙන වෙනම ලංසු ඇගයීමට කටයුතු නොකර කාණ්ඩ 04 කට වර්ග කර ලංසු කැඳවා ඇගයීම් කර මිලදී ගැනීම නිසා රජයට රු.706,160 ක පාඩුවක් සිදුවී තිබුණි.

(v) 2014 වර්ෂයේදී පවත්වා තිබුණු ගුරු ප්‍රතිභා ප්‍රණාම උළෙල වෙනුවෙන් එකක් රු. 1,200 ක් බැගින් සමරු තිළිණ 850 ක් රු.1,165,248 කට මිලදී ගෙන තිබුණි. වෙළඳපොළ මිල සැඳහුම් ක්‍රමයට සැපයුම්කරුවන් තෝරාගෙන මිලදී ගැනීම් සිදු කරන බව තහවුරු කිරීම සඳහා පිළියෙල කරන ලද ලේඛන මත මිලදී ගැනීම සිදුකර තිබුණු අතර සාමාන්‍ය වෙළඳපලේ සමාන පිරිවිතර සහිත සමරු තිළිණයක් රු.650 කට මිලදී ගැනීමට හැකි බවට කරුණු අනාවරණය විය.

(vi) මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර සඳහා සිහිවටන නාම පුවරු 71 ක් සපයා සවි කිරීම වෙනුවෙන් එකතු කළ අගය මත බදු රහිතව එකක් රු.174,000 බැගින් සැපයුම්කරුවන් දෙදෙනෙකු වෙත ඒකාබද්ධ අරමුදලින් රු.12,438,073 ක් හා මෙම ව්‍යාපෘතියෙන් රු.734,840 ක් වශයෙන් එකතු කළ අගය මත බදු සහිත මුළු මුදල රු.13,172,913 ක් ගෙවා තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 මාර්ගෝපදේශය ප්‍රකාරව ජාතික තරඟකාරී ලංසු කැඳවා නොතිබුණි. ඒ වෙනුවට වෙළඳපොළ මිල සැඳහුම් ක්‍රමයට සැපයුම්කරුවන් තෝරාගෙන මිලදී ගැනීම සිදු කරන බව තහවුරු කිරීම සඳහා ලේඛන පිළියෙල කර මිලදී ගැනීම සිදු කර තිබුණි. එම පිරිවිතරයට සමාන සමරු ඵලකයක් වෙළඳපලේ රු.129,000 කට මිලදී ගැනීමට හැකි බවට කරුණු අනාවරණය විය.

(vii) 2014 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් වැය විෂයන් 04 කට සළසා තිබුණු ප්‍රතිපාදන සැලැසුම් කර තිබුණු පරිදි උපයෝජනය කර නොතිබුණි. ඒ

හේතුවෙන් රු.76,479,951 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. 2014 දෙසැම්බර් 31 දින වන විට එක් පාසලකට රු.600,000 බැගින් පාසල් 149 ක් වෙත රු.89,400,000 ක ප්‍රතිපාදන මුදාහැර තිබුණි. ප්‍රාග්ධන වියදම් අවශ්‍යතාවයන් නිශ්චිත ලෙස හඳුනාගෙන ප්‍රමුඛතා ලැයිස්තු පිළියෙල කිරීමකින් තොරව 2014 දෙසැම්බර් 31 දින මුදල් බෙදාහැරීම හේතුකොට ගෙන 2014 වර්ෂයේදී රු.89,400,000 ක් වියදම් කිරීමට නොහැකිවී තිබුණත්, එම වටිනාකම 2014 වර්ෂයේ රාජ්‍ය වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(viii) උසස් පෙළ විද්‍යා විෂය ධාරාව සඳහා ශිෂ්‍ය සහභාගීත්වය වැඩි කිරීම හා විද්‍යා විෂයය පිළිබඳ ශිෂ්‍ය සාධන මට්ටම ඉහළ නැංවීමේ අරමුණ ඉටු කර ගැනීම සඳහා තාක්ෂණික විද්‍යාගාර 860 ක් ඉදිකිරීමටත්, කාර්යාල හා විද්‍යාගාර උපකරණ සහ ලී බඩු මිලදී ගැනීමටත්, කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සඳහාත් 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලය තුළදී ව්‍යාපෘතියෙන් හා දේශීය අරමුදලින් එකතුව රු.11,349,316,686 ක ප්‍රතිපාදන සළසා තිබුණි. 2014 දෙසැම්බර් 31 දින වන විට ඉන් රු.11,279,749,122 ක් වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් වූ පහත සඳහන් කරුණු හේතුවෙන් ප්‍රමාණවත් කාර්යසාධනයක් ළගා කර ගැනිමට නොහැකි වී තිබුණි.

- 2013 වර්ෂයේදී අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විද්‍යා විෂය සඳහා A හෝ B සාමාර්ථ ලබා ගත් සිසු දරුවන්ගේ ප්‍රතිශතය සියයට 16 ක් වුවත් එය 2014 වර්ෂයේදී සියයට 13 දක්වා අඩුවී තිබුණි.
- විෂය ධාරාව හදාරණ එකම සිසු දරුවෙකු හෝ ගුරුභවතෙකු හෝ නොමැතිවීම හේතුවෙන් සැලැසුම් කළ පරිදි විෂය ධාරාව ආරම්භ කිරීමට පාසැල් 13 කට නොහැකි වී තිබුණි.
- විෂය ධාරාව අළුතින් ආරම්භ කරන ලද පාසැල් 140 ක, 2014 වර්ෂය වන විට විෂය ධාරාව හදාරන 12 හා 13 ශ්‍රේණිවල මුළු සිසු දරුවන් සංඛ්‍යාව පිළිවෙලින් 866 ක් හා 712 ක් වී තිබුණි. එම පාසැල් 140 න් ශ්‍රේණි දෙකෙහිම සිසු දරුවන් 1 ත් 10 ත් අතර සංඛ්‍යාවක් සහිත පාසල් 82 ක්ද, සිසු දරුවන් 11 ත් 22 ත් අතර සංඛ්‍යාවක් සහිත පාසල් 58 ක්ද වී තිබුණි.
- විෂය ධාරාව හදාරන සිසු දරුවන් එක් අයෙකු හෝ සිටින නමුත් විෂයයන් තුනම සඳහා එක ගුරු භවතෙකු හෝ නොමැති පාසැල් 08 ක් ඇතුළුව විද්‍යා විෂය ධාරාව අළුතින් ආරම්භ කළ පාසැල් 57 ක සමස්ථ ගුරුභවතුන්ගේ ඌනතාවය 88 ක්ව පැවැතුණි.

(ix) පාසල් පාදක ගුරු සංවර්ධන වැඩසටහන සඳහා මෙම ව්‍යාපෘතිය මඟින් 2012, 2013 හා 2014 යන වර්ෂවලදී රු.6,062,459 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර, එම වර්ෂ තුන තුළදී රු.5,549,381 ක් වැයකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

- මෙම වැඩසටහන සම්බන්ධයෙන් නිකුත් කර තිබුණු මාර්ගෝපදේශ සංග්‍රහය සරල භාෂාවෙන් පිළියෙල කර නොතිබුණි.
- 2015 ජුනි මාසය වන විට අධ්‍යාපන ක්ෂේත්‍රයේ විවිධ මට්ටම්වල නිලධාරීන් වෙත පුහුණුකිරීමේ හා දැනුවත් කිරීමේ වැඩමුළු පවත්වා තිබුණද, එම එකිනෙක නිලධාරීන් වෙත වගකීම් පවරා නොතිබුණි.
- විදුහල්පතිවරුන් වෙතින් නිසි පරිදි ප්‍රගති වාර්තා ලබා ගෙන නොතිබුණු අතර බොහෝ විදුහල්පතිවරුන් මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම පිළිබඳව සම්පූර්ණ අවබෝධයක් ලබා ගෙන නොතිබුණි. ආකල්පමය හා කැපවීමේ දුර්වලතා, පාසල් කාලය තුළ සියළුම ගුරු භවතුන් ආවරණය වන ලෙස ක්‍රියාත්මක කිරීමට ප්‍රායෝගිකව ඇති අපහසුව, 2014 දෙසැම්බර් 31 දින වන විටත් සම්පත් දායකයින් හඳුනාගෙන නොතිබීම හා තාක්ෂණික උපකරණ කට්ටල පිළියෙල කර නොතිබීම, ප්‍රමාණවත් භෞතික හා මූල්‍ය සම්පත් නොමැතිවීම යන කරුණු හා මෙම වැඩසටහන යටතේ ගුරු සංවර්ධනයට අදාළ නොවන ක්‍රියාකාරකම් සිදුකර තිබීම වැනි කරුණු නිසා මෙම වැඩසටහන සාර්ථක ලෙස ක්‍රියාත්මක වී නොතිබුණි.

(x) රජයේ පාසල් නාම ලේඛනයෙන් පිටපත් 17,000 ක් මුද්‍රණය සඳහා 2014 වර්ෂයේදී රු.10,750,000 ක් වැය කර තිබුණි. අවශ්‍ය ප්‍රමාණයට වඩා පිටපත් 3,894 ක් මුද්‍රණය කර තිබුණු අතර එහි පිරිවැය රු.2,622,100 ක් විය.

## 3.13 දේශීය මුල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

---

පිහිනුම් තටාකයක් ඉදිකිරීමේ අරමුදලක් සඳහා කොළඹ කළාපයේ ජාතික පාසලක් විසින් 2007 වර්ෂයේ සිට රු.15,000,000 ක් එකතු කර ස්ථාවර තැන්පතුවක තැන්පත් කර තිබුණු නමුත් 2014 අගෝස්තු 06 දින වන විටත් පිහිණුම් තටාකය ඉදිකිරීමේ කටයුතු නිමකර නොතිබුණි.

## 3.14 කාර්යසාධනය

2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

### (අ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්

අමාත්‍යාංශය විසින් ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටුනොකර තිබුණු පහත සඳහන් අවස්ථා කිහිපයක් නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය විය.

(i) මහින්දෝදය තාක්ෂණ විද්‍යාගාර 860 ක් ඉදිකිරීම සඳහා 2012, 2013, හා 2014 වර්ෂවලදී රු.8,557,156,625 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර 2014 දෙසැම්බර් 31 දින වන විට තථ්‍ය වියදම රු.8,519,672,614 ක් වී තිබුණි. එදිනට ඉදිකිරීම් සම්පූර්ණ කර තිබුණු විද්‍යාගාර 822 ක් වූ අතර අර්ධ නිමි විද්‍යාගාර ප්‍රමාණය 38 ක් විය. අර්ධ නිමි විද්‍යාගාර 04 ක ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් විසින් ඒවායේ වැඩ අත්හැර තිබුණු නමුත්, 2015 ජුනි 15 දින වන විටත් ඔවුන්ගේ රු.4,901,818 ක් වූ අත්තිකාරම් හා කාර්යසාධන ඇප බැඳුම්කර මුදල් කර ගැනීමටද, ඉටුනොකළ වැඩවලින් සියයට 20 කට සමාන රු.5,764,641 ක් කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගැනීමටද, අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

(ii) අඩු ශිෂ්‍ය සංඛ්‍යාවක් සිටින පාසල් වෙත පහසුකම් ලබාදෙමින් වැඩිදියුණු කිරීම, පාසල් අතර විෂමතාවයන් අවම කිරීම, ජනප්‍රිය පාසල්වලට ඇති තරඟකාරිත්වය අඩු කිරීම, පාසල් හැර යන සිසුන් සංඛ්‍යාව අවම කර ගැනීම හා පාසල හා ප්‍රජාව අතර සම්බන්ධතාවය වැඩිකර ගැනීම යන අරමුණු පෙරදැරිව නව ආදර්ශ පාසල් 457 ක් වැඩිදියුණු කිරීමේ වැඩ සටහනක් 2008 වර්ෂයේදී ආරම්භකර තිබුණි. 2008 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා වර්ෂ 04 ක් තුළදී මෙම වැඩසටහන යටතේ පහසුකම් සැපයීම සඳහා රු.316,000,000 ක ප්‍රතිපාදන සළසා තිබුණි. නමුත් 2012, 2013 හා 2014 වර්ෂ තුන සඳහාම රු.118,000,000 ක් පමණක් ප්‍රතිපාදන සළසා තිබුණු අතර ඉන් රු.73,467,480 ක් පමණක් උපයෝජනය කර තිබුණි. මෙම වැඩසටහනෙන් පහසුකම් ලබන පළාත් සභා පාසල් 457 ක් සඳහා අමාත්‍යාංශය යටතේ ප්‍රතිපාදන නිසි ලෙස උපයෝජනය කර නොතිබුණු අතර, පළාත් සභා විසින්ද ඒ සඳහා ප්‍රතිපාදන සළසා නොතිබුණි. මේ නිසා නව ආදර්ශ පාසල් 457 ක ඉදිරි සංවර්ධන කටයුතු අඩාලවීමේ අවදානයක් පවතිණ බව නිරීක්ෂණය විය.

**(ආ) ප්‍රමාණවත් කාර්යසාධනයක් වාර්තා නොවීම.**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2012, 2013 හා 2014 වර්ෂවල පවත්වා තිබුණු 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටි ජාතික පාසල් 108 ක සිසුන්ගෙන් සියයට 50 කට වඩා අඩු ප්‍රතිශතයක් පමණක් විභාගය සමත් වී තිබුණි.

(ii) 2012, 2013 හා 2014 වර්ෂවලදී පවත්වා තිබුණු අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගවලට පෙනී සිටි ජාතික පාසැල් සංඛ්‍යාව 79 ක සිසුන්ගෙන් වර්ෂ තුනේදීම හෝ වර්ෂ දෙකකදී හෝ සියළු විෂයයන් අසමත් වූ සිසුන්ගේ ප්‍රතිශතය සියයට 10 කට වඩා වැඩි වී තිබුණි.

**3.15 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2007 සැප්තැම්බර් 05 දිනැති අංක 2007/05 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව එකතුව රු.1,191,835 ක මුදල් ශේෂ පැවැති පැරණි බැංකු ජංගම ගිණුම් 03 ක්, ශේෂයක් නොතිබුණු තවත් පැරණි බැංකු ජංගම ගිණුමක්ද, 2014 දෙසැම්බර් 31 දින වන විටත් වසා දමා නොතිබුණි.

(ආ) ජාතික පාසල් 56 ක මූල්‍ය අවශ්‍යතා සඳහා අමාත්‍යාංශයෙන් මුදල් ලැබෙන තෙක් එම පාසල් විසින් ඒවා ඉටු කර නොතිබුණි. නමුත් අදාළ ජාතික පාසල් 56 හි පාසල් සංවර්ධන සමිතිවල එකතුව රු.364,140,384 ක්වූ මුදල් 2014 දෙසැම්බර් 31 දින වන විට ස්ථාවර තැන්පත්වල ආයෝජනය කර තිබුණි.

(ඇ) 2014 වර්ෂයේදී ගුණාත්මක යෙදවුම් මිලදී ගැනීම සඳහා ජාතික පාසල් 52 ක් වෙත රු.8,693,728 ක් ලබා දී තිබුණු අතර 2014 දෙසැම්බර් 31 දින වන විට ඉන් රු.4,492,228 ක් ඉතිරිව පැවැතුණි. එම මුදල් පාසල් සංවර්ධන සමිතිවල බැංකු ජංගම ගිණුම්වල රඳවා ගෙන තිබුණි.

**3.16 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

අමාත්‍යාංශය විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) කොළඹ කලාපයේ ජාතික පාසලක මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.2,900,000 ක් වූ ගෘහස්ත ක්‍රීඩාංගණයක් ඉදිකිරීම සඳහා 2001 වර්ෂයේදී ආදි ශිෂ්‍යාවන්ගේ හා පාසැල් සංවර්ධන සමිතියේ දායකත්වයෙන් අරමුදල් රැස්කර තිබුණි. 2014 ජූනි 30 දින වන විට ඒ වෙනුවෙන් රු.13,024,066 ක් වැයකර තිබුණි. මෙම කාලය තුළදී අවස්ථා

තුනකදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය නොකර කොන්ත්‍රාත්කරුවන් තිදෙනෙකු වෙත එම ඉදිකිරීම් කටයුතු භාරදී තිබුණි. මුල් කොන්ත්‍රාත්කරුවන් දෙදෙනාගේ වැඩ අවසන් කළ බව හෝ ඊට හේතු වූ කරුණු අනාවරණය නොකෙරුණි. තෙවන කොන්ත්‍රාත්කරු වෙත අතිරේක වැඩ සඳහා රු.2,336,859 ක් ගෙවා තිබුණු අතර අදාළ අනුමැතින් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. වර්ෂ 13 ක පමණ කාලයක සිට අත්තිවාරම් දැමීම හා කොන්ක්‍රීට් කණු ඉදිකිරීමට අදාළ යකඩ කම්බි වැර ගැන්නුම් පමණක් කර ඒවා ස්වභාවික ව්‍යවසනයන්ට හසුව දිරාපත් වෙමින් තිබුණි. තවද පාසලේ දෙමාපියන්ගේ හා ආදි ශිෂ්‍යාවන්ගෙන් එකතුකර 2010 ජුලි 27 දින අධ්‍යාපන අමාත්‍යාංශයේ පොදු තැන්පත් ගිණුමට බැර කිරිම සඳහා විද්‍යාලය විසින් එවා තිබුණු රු.25,600,000 කින් රු.8,235,116 ක් පමණක් මෙම ඉදිකිරීම වෙනුවෙන් වැයකර තිබුණි. ඉතිරි රු.17,364,884 ක් රජයේ ආදායමට බැරකර තිබුණි.

(ආ) 2015 ජුලි 20 දින වන විට පරිගණකාගාර 775 ක් සඳහා පරිගණක හා ලැප්ටොප් ඇතුළු අදාළ අනෙකුත් උපකරණ සපයා සවිකරවා ගෙන තිබුණු අතර මුළු වියදම රු.5,618,503,996 ක් විය. මේ පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2013 සැප්තැම්බර් 19 දිනැති අංක 13/1239/530/031-11 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, පරිගණක එකලස් කරන දේශීය කර්මාන්තකරුවන්ටද, ලංසු ඉදිරිපත් කළ හැකිවන පරිදි ජාතික විවෘත ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය අනුගමනය කරමින් පරිගණකාගාර 100 ක් සඳහා අන්තර් ජාතික තත්ත්වයේ පරිගණක මාදිලියක (International Branded) පරිගණක, ලැප්ටොප් හා ප්‍රින්ටර් ඇතුළු අදාළ අනෙකුත් උපකරණ මිලදී ගත යුතුව තිබුණි. සැපයුම්කරු සතු විය යුතු සුදුසුකම් පිළිබඳව නිසි පරිදි ඇගයීම් නොකරමින්, අන්තර්ජාතික තත්ත්වයේ පරිගණක මාදිලියක් (International Branded) නොවන පරිගණක හා ලැප්ටොප් ඇතුළු අනෙකුත් උපකරණ මිලදී ගෙන තිබුණි.

(ii) 2014 වර්ෂයේදී අවස්ථා තුනකදී ගෙන තිබුණු අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාරව, එම සැපයුම්කරුගෙන්ම තවත් පරිගණකාගාර 665 ක් සඳහා පරිගණක හා ලැප්ටොප් ඇතුළු අනෙකුත් උපකරණ මිලදී ගෙන තිබුණු අතර ඒවාද අන්තර් ජාතික තත්ත්වයේ පරිගණක මාදිලියක (International Branded) නොවන පරිගණක හා ලැප්ටොප් වී තිබුණි.

(iii) 2014 වර්ෂයේදී විවෘත ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින්, දැනුම කේන්ද්‍රීය පදනම ලෙස පාසල් අධ්‍යාපන පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ

ව්‍යාපෘති අරමුදලින් රු.277,239,376 ක් වැයකර අන්තර් ජාතික තත්ත්වයේ පරිගණක මාදිලියක පරිගණක, ලැප්ටොප්, ප්‍රින්ටර් හා අදාළ අනෙකුත් උපකරණ පරිගණකාගාර 40 ක් සඳහා මිලදී ගෙන තිබුණු අතර එක් පරිගණකාගාරයක් සඳහා රු.6,930,984 ක් පමණක් වැය කර තිබුණි. නමුත් ඉහත සඳහන් පරිදි පරිගණකාගාර 775 ක් සඳහා අන්තර් ජාතික තත්ත්වයේ පරිගණක මාදිලියක නොවූ පරිගණක හා උපකරණ සඳහා එක් පරිගණකාගාරයක් වෙනුවෙන් රු.7,271,171 ක් වැයකර තිබුණි.

(iv) 2015 ජූලි 20 දින වන විට පරිගණකාගාර 775 ක් වෙත පරිගණක, ලැප්ටොප්, ප්‍රින්ටර් හා අදාළ අනෙකුත් උපකරණ සපයා අවසන් කර තිබුණු නමුත්, එදින වන විට පරිගණකාගාර 345 ක් පමණක් ප්‍රයෝජනයට ගන්නා බවත්, විදුලිය සැපයීමේ ප්‍රමාදයන් සහ විද්‍යාගාර සිසු අයිතියට පත් කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් ඉතිරි පරිගණකාගාර ප්‍රයෝජනයට ගෙන නොතිබුණු බවත් අනාවරණය විය.

## 3.17 අවිධිමත් ගනුදෙනු

-------------------

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**(අ) අධිකාර බලය නොමැති වූ ගනුදෙනු**

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මහින්දෝදය තාක්ෂණ විද්‍යාගාර විවෘත කිරීම හා මහින්දෝදය තාක්ෂණ විද්‍යාපීඨ සඳහා මුල්ගල තැබීමේ උත්සව ප්‍රචාරණ වියදම් හා වෙනත් ප්‍රචාරණ වියදම් සඳහා රු.10,046,188 ක් 2014 වර්ෂයේදී වැය කර තිබුණි. ඊට අමතරව 2014 දෙසැම්බර් 31 දින වන විට රු.2,529,462 ක බැරකම්වලට එළඹ තිබුණි. එම උත්සවවලට අවශ්‍ය උපකරණ කුලියට ගැනීම සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට පටහැනිව තවත් රු.1,100,000 ක් වැයකර තිබුණි. ප්‍රචාරණ වියදම් වෙනුවෙන් වැය විෂයයකට ප්‍රතිපාදන සළසා නොමැති බැවින් එම මුළු වියදම වූ රු.11,146,188 ක් ප්‍රාග්ධන වැය විෂයයන් දෙකක් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ii) 2014 වාර්ෂික අයවැය යෝජනාවක් වූ පිරිවෙන් පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා රු.300,000,000 ක ප්‍රතිපාදන සළසා තිබුණි. පිරිවෙන් තුන් අවුරුදු සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ජාතික වැඩ සටහනක් ලෙස හඳුන්වාදීම සඳහා

ඉන් රු.4,584,051 ක් වැයකර තිබුණි. එම උත්සවය පැවැත්වීම වෙනුවෙන් කර තිබුණු වියදම ඵලදායි වියදමක් වි නොතිබුණි.

(iii) 2014 වර්ෂයේදී ජාතික පාසල් 86 ක විවිධ ක්‍රීඩා ඉසව් සඳහා සහභාගී වූ සිසු දරුවන් සංඛ්‍යාව 42,488 ක් වූ අතර ඉන් සිසු දරුවන් 15,790 දෙනෙකුගෙන් රු.5,667,900 ක් අයකර ගෙන තිබුණු අතර බාහිර ක්‍රීඩා පුහුණුකරුවන් වෙත රු.49,870,800 ක් ගෙවා තිබුණි.

**(ආ) වෙනත් ගනුදෙනු**

------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) කොළඹ කලාපයේ ජාතික පාසැලක් විසින් 2013 වර්ෂයේදී පවත්වා තිබුණු ප්‍රසංගයකින් ලැබී තිබුණු මුළු ආදායම රු.10,501,717 ක් හා මුළු වියදම රු.10,501,717 ක් විය. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- සමරු කළාප ආදායම රු.7,987,500 ක් වූ අතර සමරු කලාපයේ පළකර තිබුණු දැන්වීම් 1,296 ක් අතරින් 367 ක් සිසු දරුවන්ගේ නම්වලින් පළ වී තිබුණි. සමරු කලාපයේ පළ කිරීම සඳහා සෑම දරුවෙකුම එක දැන්වීමක් හෝ සපයාදිය යුතුය යන කොන්දේසි ඉදිරිපත් කර තිබුණු බව විගණනයේදී තහවුරු වී තිබුණි.

- සමරු කලාපයේ පළකිරීමට, අදාළ දැන්වීම සමඟ පාසල වෙත ලබාදී තිබුණු ආකෘති පත්‍ර එකතුකර තැබීමට කටයුතු කර නොතිබුණු බැවින් සමරු කලාපයේ පළකරන ලද දැන්වීම් සඳහා පමණක් මුදල් ලද හෝ නොලද බව පරීක්ෂා කිරීමට සිදුවිය. ඒ අනුව මුදල් අයකර ඇති නමුත් දැන්වීම සමරු කළාපයේ පළනොකර මුදල් අවභාවිතයට ගත් අවස්ථා නොමැති බව තහවුරු කර ගැනීමට නොහැකි විය.

- 2015 ජූලි 13 දින වන විට දැන්වීම් 148 ක් සඳහා හිඟ ආදායම රු.933,000 ක්වූ අතර පාසලේ ගුරුභවතුන් කිහිප දෙනෙකු හා දෙමාපියන් කිහිප දෙනෙකු විසින් අවභාවිතයට ගෙන තිබුණු විගණනයෙන් පසුව භාරදී තිබුණු මුදල රු.205,500 ක් වී තිබුණි.

- ප්‍රසංගය වෙනුවෙන් මුද්‍රණය කර තිබුණු ප්‍රවේශ පත්‍ර ආදායම රු.1,524,250 ක් වුවත්, 2015 ජූලි 13 දින වන විට හිඟ ප්‍රවේශ පත්‍ර ආදායම රු.286,033 ක් වී තිබුණි.

- ප්‍රසංගය සඳහා අවස්ථා 03 කදී සේවාවන් සපයා ගෙන රු.347,500 ක් වැය කර තිබුණු අතර වෙනත් අවශ්‍යතා සඳහා අවස්ථා 07 කදී විවිධ භාණ්ඩ හා සේවා මිලදී ගෙන රු.662,950 වැය කර තිබුණි. මෙම ගනුදෙනු සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ බව සනාථ කිරීම සඳහා ව්‍යාජ ලිපි ලේඛන ඉදිරිපත් කර තිබුණි.

(ii) 2006 නොවැම්බර් 22 දිනැති අංක අමප /06/2125/206/072 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, අධ්‍යාපන අමාත්‍යාංශයේ පාලනය හා අධීක්ෂණය යටතේ රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ සහයෝගය ලබා ගෙන ත්‍රිවිධ හමුදාවේ හා පොලිස් සාමාජිකයින්ගේ දරුවන්ට අධ්‍යාපනය ලබාදීමේ අරමුණින් කොළඹ ආරක්ෂක සේවා විද්‍යාලය 2007 ජනවාරි මාසයේ සිට ආරම්භ කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- විදුහල පවත්වාගෙන යාමට අවශ්‍ය නෛතික රාමුවක් ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි.

- අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 116 දෙනෙකු පාසලට අනුයුක්ත කර තිබියදී, රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය විසින් ආරක්ෂක අංශයේ නිලධාරීන් 73 දෙනෙකු පාසලේ විවිධ තනතුරු සඳහා අනුයුක්ත කර තිබුණි. එම අමාත්‍යාංශය විසින් පත්කර තිබුණු කළමණාකරණ මණ්ඩලය විසින් ගනු ලබන තීන්දු තීරණ පාසල තුළ ක්‍රියාත්මක කර තිබුණු බැවින්ද, අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව මෙන්ම වෙනත් කිසිදු අධිකාරී බලයකින් තොරව එක් ශිෂ්‍යයෙකුගෙන් වර්ෂයකට රු.1,200 ක් අයකරමින්ද, පාසලේ අවහන්හල, පොත්හල, රෙදිහල හා පිහිනුම් තටාකවලින් ආදායම් අයකරමින් උපයන මුදල් ආරක්ෂක සේවා විද්‍යාලය නමින්වූ බංකු ගිණුමකට බැර කර තිබුණි. ඒ සඳහා වන වියදම් එම ගිණුමට හර කර තිබුණි. ඒ අනුව ආරක්ෂක අංශ විසින් පාසලේ පරිපාලන හා අධීක්ෂණ කටයුතුවලට මැදිහත්වී තිබුණු බව නිරීක්ෂණය විය.

- නිල ඇඳුමෙන් හා සිවිල් ඇඳුමෙන් යුක්ත ආරක්ෂක අංශ නිලධාරීන් හා සේවකයින් පාසල් වේලාවේදී හා ඉන් පසුව පාසල් පරිශ්‍රය තුළ හැසිරීම පාසලක් තුළ පැවතිය යුතු යෝග්‍ය තත්ත්වයට නොගැලපෙන

බව නිරීක්ෂණය විය. එය පාසැල් පරිශ්‍රය තුළදී දරුවන්ගේ ආරක්ෂාව, විනය හා යහපැවතුම් සම්බන්ධයෙන් විදුහල්පතිවරයා ඇතුළු අධ්‍යයන කාර්ය මණ්ඩලය සතු වගකීම සෘජුවම ඔවුන් වෙත පවරාදීම පිළිබඳ ප්‍රශ්ණකාරී තත්ත්වයක්ද වී තිබුණි.

- ඉගෙනුම ලබන සියළුම සිසු දරුදැරියන් ආරක්ෂක අංශවලට අයත් පවුල්වල දරුදැරියන් පමණක් වන බැවින් විවිධ සමාජ හා සංස්කෘතික සබැඳියාවන් සහිත දරුවන් සමඟ සම්මිශ්‍රණයවී අධ්‍යාපනය ලැබීමේ වරම් අහිමිවීම තුළ අධ්‍යාපනයෙන් බිහිකිරීමට බලාපොරොත්තු වන යහපත් පුරවැසියෙකු බිහිකළ හැකිද යන බවත්, එක් සමාජ පන්තියක් අරමුණු කොට ගෙන මෙවැනි සුවිශේෂී පාසල් පිහිටුවීමට කටයුතු කිරීම තුළ සෙසු සමාජ පන්ති සඳහා අසාධාරණයක් සිදුවීම තුළ මතභේදාත්මක තත්ත්වයන් පැන නැඟිය හැකි බවත් නිරීක්ෂණය විය.

## 3.18 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු
--------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ වංචනික ස්වරූපයේ ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව කටයුතු කරමින්, අභ්‍යන්තර පාලනයක් ඇතිවන ලෙස වැඩ බෙදා වගකීම් පැවරීමට කටයුතු නොකරමින් හා යටත් නිලධාරීන්ට අනිසි බලපෑම් සිදුකර චෙක්පත් සඳහා අත්සන් ලබා ගැනීමට කටයුතු කරමින්, තම ප්‍රථම පත්වීමේ සිට වර්ෂ 28 ක් විදුහලේ විවිධ තනතුරුවල සේවය කර දැනට වැඩබලන විදුහල්පති වශයෙන් කටයුතු කරන ගම්පොළ කලාපයේ ජාතික පාසලක විදුහල්පතිනිය විසින් 2013 හා 2014 වර්ෂවලදී සිදුකර තිබුණු රු.2,711,160 ක්වූ ගනුදෙනු පිළිබඳ නියැදි පරීක්ෂාවේදී රු.205,080 ක් අවභාවිතයට ගෙන තිබුණි.

(ආ) පස්යාල සිරිසඟබෝ විශේෂිත ළමා පාසලක් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි පාසලක් බවට පත් කිරීම සඳහා පාසල් කළමණාකරු විසින් ඉල්ලීමක් කර තිබුණු අතර එම ඉල්ලීම ලද අවස්ථාවේ සිට අදාළ නිලධාරීන් විසින් අවිධිමත් ලෙස කටයුතු කරමින් ලියාපදිංචිය පමා කර තිබුණු නමුත් ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කර නොතිබුණි. ඒ අතර තුළදී ලියාපදිංචිය සිදුකර දීම සඳහා පාසල් කළමණාකරුගෙන් රු.1,000,000 ක අල්ලසක් ලබා ගැනීමට බාහිර පාර්ශවයක් විසින් උත්සාහ කර තිබුණු බවද අනාවරණය වී තිබුණි.

**3.19 පාඩු හා හානි**

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) 2014 දෙසැම්බර් 31 දින වන විට ජාතික පාසැල් 67 ක ගිවිසුම් ප්‍රකාරව අයකර නොතිබුණු ආපන ශාලා හිඟ ආදායම රු.4,386,773 ක් වී තිබුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දින වන විට ජාතික පාසල් 03 ක අයකර නොතිබුණු ශ්‍රවණාගාර හිඟ කුලී ආදායම රු.26,500 ක් වී තිබුණි.

**3.20 අනාර්ථික ගනුදෙනු**

තම පාසල්වල හෝ අවට සහෝදර පාසල්වල හෝ ප්‍රමාණවත් ශ්‍රවණාගාර හෝ ශාලා පහසුකම් තිබියදී ජාතික පාසල් 20 ක විවිධ උත්සව සඳහා පෞද්ගලික ආයතන සතු ශ්‍රවනාගාර හෝ ශාලා පහසුකම් ලබා ගැනීම සඳහා 2014 වර්ෂයේදී පමණක් රු. 9,299,125 ක් වැයකර තිබුණි.

**3.21 විසඳා නොතිබුණු විගණන ඡේද**

අමාත්‍යාංශයට අදාලව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| **වර්ෂය** | **ඡේද අංකය** | |
| 2013 | 1.5 (අ) (i) | අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි පන්තියක සිටිය යුතු උපරිම සිසුන් සංඛ්‍යාව 42 ක සීමාව ඉක්මවා, ළමුන් ඇතුළත් කර ගැනීමේ චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව, මාතර රාහුල විද්‍යාලයට ළමුන් 35 දෙනෙකු ඇතුළත්කර ඇති බවට විගණකාධිපතිවරයා වෙත ලැබී තිබුණු නියෝජනය පරීක්ෂා කිරීමට අදාළ තොරතුරු හා ලිපිගොනු විගණනයට ඉදිරිපත්කර නොතිබුණි. |
| 2013 | 1.5 (ඇ) හා (ඉ) | ඉන්ධන සීමාව ඉක්මවා, ඉකුත් වර්ෂය හා සමාලෝචිත වර්ෂය තුළදී නිල වාහනයක් හා ආරක්ෂක රථ 02ක් සඳහා එකතුව රු.2,399,914 |

ක ඉන්ධන නිකුත් කර තිබුණි. ඉකුත් වර්ෂය හා සමාලෝචිත වර්ෂය තුළදී අමාත්‍ය කාර්ය මණ්ඩල නිලධාරීන් 08 දෙනෙකු වෙත වෙන්කළ වාහන 08 ක් වෙනුවෙන් නිකුත් කළ යුතු ඉන්ධන සඳහා රු.1,676,232 ක් නියමිත පරිදි වැටුපට එකතුකර ගෙවා තිබියදී, ඊට අමතරව නිකුත් කර තිබුණු ඉන්ධනවල වටිනාකම රු.1,230,871 ක් විය.

**3.22 කළමනාකරණ දුර්වලතා**

-------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) පස්වන ශ්‍රේණි ශිෂ්‍යත්වලාභීන්ට ශිෂ්‍යාධාර ගෙවීම් සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරයා විසින් නිකුත් කර තිබුණු චක්‍රලේඛයේ 8.2 ඡේදයේ දැක්වෙන විධිවිධානවලට පටහැනිව, සමස්ථ කළාප අධ්‍යාපන කාර්යාල 97 න් කළාප අධ්‍යාපන කාර්යාල 50 ක නියැදියක් පරීක්ෂා කරන ලදී. 2006 ජුනි 20 දිනැති අංක 2006/27 දරන අධ්‍යාපන අමාත්‍යාංශයේ චක්‍රලේඛයේ 8.2 ඡේදයට අනුකූල නොවී, ජාතික පාසල් 119 කට අදාළව මුළු ශිෂ්‍යත්වධාරීන් 24,506 ක් වෙත රු.52,956,000 ක්ද, නියමිත පරිදි වවුචර්පත් ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ජාතික පාසල් 29 කට අදාළව මුළු ශිෂ්‍යත්වලාභීන් 1,813 ක් වෙත රු.4,526,500 ක්ද වශයෙන් එකතුව රු.57,482,500 ක ශිෂ්‍යාධාර ගෙවා නොතිබුණි. 2014 දෙසැම්බර් 31 දින වන විට අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ප්‍රතිපාදන ලබා නොදීම හේතුවෙන් එම ශිෂ්‍යත්වලාභීන් වෙතශිෂ්‍යාධාර ගෙවීමට නොහැකිවී තිබුණු බව අනාවරණය විය.

(ආ) ශිෂ්‍ය පැමිණීමේ සාමාන්‍යය ඇතුළත් වාර්ෂික වාර්තා නිසි පරිදි පිළියෙල කරවා ගෙන්වා ගැනීම සඳහා විධිමත් වැඩ පිළිවෙලක් හඳුන්වාදී නොතිබීම, නිසි පසුවිපරමක් සිදුකර නොතිබීම, ප්‍රමාණවත් ප්‍රතිපාදන සළසා ගැනීම කෙරෙහි අවධානය යොමුකර නොතිබීම හා ක්‍රියාකාරි සැලැස්මකට අනුව විධිමත්, ක්‍රමවත් හා සාධාරණ ලෙස ප්‍රදාන හා ආධාර මුදල් බෙදී යන වැඩ පිළිවෙලක් හඳුන්වාදී නොතිබීම ආදී වූ කරුණු හේතුවෙන්, 2006 අගෝස්තු 24 දිනැති අංක අමප/06/1465/229/083 දරන අමාත්‍ය මණ්ඩල තීරණය හා 1980 අංක 1 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග මාලාවේ 11 උප ලේඛනයේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව සෑම ලියාපදිංචි පිරිවෙනක් වෙතම ගෙවිය යුතුව තිබුණු ශිෂ්‍ය ප්‍රදාන හා පුස්තකාල ආධාර නියමිත පරිදි ගෙවා නොතිබුණි. 2014 දෙසැම්බර් 31 දින වන විට හිඟ හිටි මුදල රු.3,018,700 ක් වී තිබුණි.

(ඈ) ජාතික පාසල් 42 ක ගුරුභවතුන් 788 දෙනෙකු වෙත අවස්ථා 2,240 කදී පුස්තකාල පොත් බැහැර දී තිබුණත්, එම පොත් ප්‍රමාද වී ආපසු භාරදි තිබුණි. නමුත් ඒ සඳහා ප්‍රමාද ගාස්තු අයකර ගෙන නොතිබුණි.

(ඇ) ජාතික පාසැල් 54 ක ගුරුභවතුන් 383 දෙනෙකු ස්ථාන මාරුවීම්, විදේශගත වීම්, විශ්‍රාමයාම් හා සේවයෙන් ඉවත්වීම් වැනි අවස්ථාවලදී ආපසු භාරදී නොතිබුණු පොත් සංඛ්‍යාව 1,033 ක් වූ අතර එහි වටිනාකම රු.156,834 ක් විය. එම පොත් හෝ ඒවායේ වටිනාකම හෝ ආපසු ලබා නොගෙන එම ගුරුභවතුන් සේවයෙන් නිදහස් කර තිබුණි.

(ඉ) ජාතික පාසල් 54 ක් වෙත දෙවන භාෂාවක් ලෙස දෙමළ හෝ සිංහල ඉගැන්වීම සඳහා ප්‍රමාණවත් ගුරුභවතුන් සංඛ්‍යාවක් අනුයුක්ත කර නොතිබුණු අතර ඒ සඳහා බාහිර ගුරුභවතුන් 76 දෙනෙකු බඳවා ගෙන 2013 හා 2014 වර්ෂවලදී පමණක් වැටුප් ලෙස රු.10,619,307 ක් පාසල් සංවර්ධන සමිතිවලින් ගෙවා තිබුණි.

(ඊ) 2014 වර්ෂයේදී හා ඊට පෙර කාලය සඳහා ජාතික පාසල් 149 ක අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 4,732 දෙනෙකු පුරුද්දක් ලෙස ප්‍රමාදවී සේවයට වාර්තා කර තිබුණු අතර ඉන් අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 4,123 දෙනෙකුගේ ප්‍රමාදය, ප්‍රථම කාලපරිච්ඡේදය ඉගැන්වීමෙන් තොරවීම කෙරෙහි ඍජුවම බලපා තිබුණි.

(උ) ජාතික පාසල් 15 ක ගුරුභවතුන් 29 දෙනෙකු ඔවුන් පත්වීම් ලද විෂයයට පරිබාහිර විෂයයන් ඉගැන්වීම සඳහා අනුයුක්ත කර තිබුණි. විශේෂයෙන් ජාතික පාසල් 04 ක ප්‍රාථමික ගුරු පුහුණුව නොලද ගුරුභවතුන් 06 දෙනෙකු ප්‍රාථමික ශ්‍රේණිවලට අනුයුක්ත කර තිබුණි.

(ඌ) 6 ශ්‍රේණියේ සිට අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) දක්වා වූ ශ්‍රේණිවලට අදාළ පාඩම් සිංහල හා දමිල බසින් පටිගත කර ඩයලොග් සැටලයිට් නාලිකාවන් දෙකක් ඔස්සේ විකාශනය සඳහා පාසල් 1962 කට පහසුකම් ලබාදී තිබුණි. මේ වෙනුවෙන් ඩයලොග් ආයතනය විසින් රු.10,300,020 ක් වැය කර රූපවාහිනි යන්ත්‍ර 2005 ක් ලබාදී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- පන්ති කාලසටහන තුළට මෙම වැඩසටහන වෙනුවෙන් කාලපරිච්ඡේද ඇතුළත් කිරීම ප්‍රායෝගිකව කළ නොහැකි වීම හා සමාන්තර පන්තිවල සියළු ළමුන්ට ප්‍රමාණවත් ඉඩකඩ ලැබී නොතිබීම නිසා පාසල තුළදී පාඩම් මාලාව

නැරඹීමට නොහැකිවී තිබුණි. විෂය නිර්දේශ අනුව වාරයට අදාළව ඉගැන්වීමට නියමිත පාඩම් මාලාවන්ට සමගාමීව මෙම වැඩසටහන මගින් විකාශනය වන පාඩම් මාලාවන් සකස් වී නොතිබීම හේතුවෙන් පාඩම් මාලාවේ ප්‍රයෝජනවත් බව අඩුවී හෝ අවම වී තිබුණි.

- ඇතැම් පාසල් වෙත ලබාදී තිබුණු රූපවාහිනී යන්ත්‍ර භාවිතයෙන් ඉවත්කර ඇන්ටනා සම්බන්ධතාවය විසන්ධි කර තිබුණි.
- රූපවාහිනී යන්ත්‍ර ආරක්ෂිත ස්ථානයක ගබඩා නොකිරීම නිසා වර්ෂා ජලයට හසුවී රු.150,732 ක් වටිනා යන්ත්‍ර 3 ක් ප්‍රයෝජනයට ගැනිමට නොහැකි පරිදි විනාශවී තිබුණි.
- වටිනාකම රු.200,976 ක් වූ රූපවාහිනී යන්ත්‍ර 04 ක් අස්ථාන ගතවී තිබුණු නමුත් ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් නෛතික විධිවිධාන ගෙන නොතිබුණි.

3.23 **මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

විගණනය සඳහා ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, 2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 2,565 | 1,189 | 1,408 | 32 |
| (ii) තෘතියික මට්ටම | 1,554 | 1,488 | 70 | 04 |
| (iii) ද්විතියික මට්ටම | 34,281 | 38,903 | 332 | 4,954 |
| (iv) ප්‍රාථමික මට්ටම | 1,152 | 4,727 | 327 | 3,902 |
| (v) වෙනත් (අනියම්/ තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 242 | 522 | 106 | 386 |
| **එකතුව** | **39,794** | **46,829** | **2,243** | **9,278** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට වූ පුරප්පාඩු 2,243 ක් පිරවීමටත්, අතිරික්තතා 9,278 ක් සඳහා විධිමත් අනුමැතිය ලබා ගැනීමටත් අමාත්‍යාංශය විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) ගුරුවිද්‍යාල 7 ක, ගුරු මධ්‍යස්ථාන 106 ක හා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ 16 ක

කථිකාචාර්ය තනතුරු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ ගුරුභවතුන් 164 දෙනෙකු තාවකාලිකව අනුයුක්ත කර තිබුණි.

(ඈ) 2014 දෙසැම්බර් 31 දින වන විට ජාතික පාසල් 75 ක පාසල් සංවර්ධන සමිතියෙන් හෝ නේවාසිකාගාර අරමුදලින් හෝ පහසුකම් හා සේවා ගාස්තු ගිණුමෙන් හෝ වැටුප් ගෙවමින් බඳවා ගෙන තිබුණු අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් සංඛ්‍යාව 341 ක් විය. ඔවුන් වෙත 2014 වර්ෂයේදී පමණක් වැටුප් හා දීමනා වශයෙන් රු.39,792,408 ක් ගෙවා තිබුණි.

## 4. ශීර්ෂ 212 - විභාග දෙපාර්තමේන්තුව

---

### 4.1 ආදායම් ගිණුම

---

20.03.02.13 දරන විභාග හා අනෙකුත් ගාස්තු ආදායම් සංකේතය යටතේ රු.4,592,907 ක ආදායම් ලැබීම හා රු.4,477,731 ක ආදායම් ආපසු ගෙවීම් කර තිබූ නමුත් එම ගනුදෙනුවලට අදාල සනාථ කිරීම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා අදාළ ආයතන විසින් ලබා දී නොතිබුණි.

### 4.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

---

විෂය අංක 21201 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.1,618,008 ක්වූ අතර, එම හිඟහිටි ශේෂවලට වර්ෂ 01 ක සිට වර්ෂ 05 ක් දක්වා කාල පරාසයක් ගත වී තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත්වී තිබුණි.

### 4.3 වත්කම් කළමනාකරණය

---

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

---

2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2014 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2015 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් 2015 මැයි 31 දින වන විටත් එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2013 වර්ෂය වෙනුවෙන් පවත්වා තිබුණි.

## 4.4 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) මුදල් රෙගුලාසි 94(1) | 24,313,203 | වාර්ෂික පුනරාවර්තන සැපයුම් හා අවිච්ඡේද වැඩ සඳහා බැදීම් හැරුණු කොට සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අනුමත ප්‍රතිපාදන ඉක්මවා බැදීම් ඇතිකරගෙන තිබුණි. |
| (ආ) මුදල් රෙගුලාසි 115(3)(අ) | 575,075 | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අනුමැතිය රහිතව ඉන්වොයිසි දිනයේ සිට වැඩකරන දින 68 ත් 88 ත් අතර කාල පමාවක් සහිතව මුදල් පසු වර්ෂයේදී ගෙවා තිබුණි. |

## 4.5 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

**ගැලපුම් කළයුතු ශේෂ**

විභාග දෙපාර්තමේන්තුව විසින් 2014 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව නිකුත් කළ නමුත් බැංකුව වෙත ඉදිරිපත් නොකළ කල් ඉකුත් වූ එකතුව රු.4,162,619 ක් වූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 4.6 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 85 | 66 | 19 | -. |
| (ii) | තෘතියික මට්ටම | 18 | 06 | 12 | - |
| (iii) | ද්විතියික මට්ටම | 419 | 306 | 113 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 164 | 175 | - | 11 |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | **-** | **10** | **-** | **10** |
| | **එකතුව** | **686** | **563** | **144** | **21** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 144 ක් පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

## 5. ශීර්ෂ 213 - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

### 5.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනය හා මුදල් රෙගුලාසි 214 ප්‍රකාර බැරකම් සටහන් කිරීමේ ලේඛනයක්ද පවත්වාගෙන නොතිබුණි.

### 5.2 පොදු තැන්පත් ගිණුම

වර්ෂ 2 ක් ඉක්මවූ (**ඉඩම් තැන්පතු හැර**) එකතුව රු.4,790,800 ක්වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### 5.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 21301 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.1,171,190 ක්වූ අතර, වර්ෂ 01 සිට වර්ෂ 05 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණු එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත්වී තිබුණි.

**5.4 වාණිජ අත්තිකාරම් ගිණුම**

විෂය අංක 21302 දරන වානිජ අත්තිකාරම් ගිණුම සම්බන්ධයෙන් සිදුකළ විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(අ) 2014 වර්ෂයේ පොත් මුද්‍රණය සඳහා මුද්‍රණකරුවන් 05 දෙනෙකුට ගෙවිය යුතු රු.5,521,000 ක් ණය හිමියන් ලෙස ගිණුමේ දක්වා නොතිබුණි.

(ආ) 2014 වර්ෂයට අදාල නොවන, ගෙවා නිදහස් කරන ලද රු. 2,586,550 ක ණයහිමි ශේෂයක් ණයහිමි ගිණුමේ සටහන් කර තිබීම නිසා එම ප්‍රමාණයෙන් බැරකම් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) ගිණුම අනුව ණයහිමි ශේෂය වු රු.14,495,000 ක්වූ අතර ණයහිමි ලේඛනය අනුව එය රු.7,280,000 ක් වූයෙන් රු.7,215,000 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඈ) යාපනය අලෙවි මධ්‍යස්ථානයේ 2014 මාර්තු මාසයේදී රු.87,680 ක අලෙවි ආදායම 2014 ජුනි මාසයේ ලැබීම් වර්ගීකරණය යටතේ දක්වා තිබුණි. එය විකුණුම් ගිණුමේ ඇතුළත් නොවීම නිසා එම ප්‍රමාණයෙන් ලාභය අවප්‍රමාණය වී තිබුණි.

(ඉ) ලී බඩු හා සවි කිරීම් ගිණුමේ සමාලෝචිත වර්ෂයේදී මිලදීගත් රු.1,296,143 ක් වටිනා ලී බඩු එකාබද්ධ අරමුදලට බැරකර ඇති අතර ගිණුමේ දක්වා ඇති උපලේඛණයට අනුව එම වටිනාකම රු.1,396,143ක් විය. මේ නිසා ලී බඩු හා සවිකිරීම් රු.100,000 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) 2013 වර්ෂයේ මිලදී ගෙන තිබු කාර්යාල උපකරණ හා සුළු උපකරණ සඳහා අත්තිකාරම් කාර්යයේ ක්ෂය ප්‍රතිපත්තිය අනුව ක්ෂයවීම් ප්‍රමාණය රු.209,610 ක් වී තිබුණත්, ගිණුමේ ලාභයට එරෙහිව රු.62,883 ක් ලෙස සඳහන් කර තිබුණි. ඒ අනුව වර්ෂයේ ලාභය සහ ස්ථාවර වත්කම්වල අගය රු.146,727 කින් අධිප්‍රමාණය වී තිබුණි.

**5.5 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| (i) | මුදල් රෙගුලාසි 94 | 296,269 | සළසා තිබුණු ප්‍රතිපාදන ඉක්මවා බැදීම් ඇති කරගෙන තිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 115 | 85,025,578 | අමාත්‍යාංශ ලේකම්ගේ හෝ අධිකාරී බලය ලත් නිලධාරියෙකුගේ අනුමැතිය ලබා නොගෙන ඉකුත් වර්ෂයට අදාල ගෙවීම් කර තිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 187 | 124,312 | දෛනික අලෙවි ආදායම හැකිතාක් අප්‍රමාදව බැංකු ගත කර නොතිබුණි. |

## 5.6 ව්‍යාජ වත්කම්

පාසල් සඳහා බෙදා හරින ලද පොත්වල වටිනාකම ඒ ඒ වර්ෂවලදී අත්තිකාරම් ගිණුමේ ගෙවීම් වශයෙන් සටහන් කිරීම වෙනුවට ණයගැතියන් වශයෙන් ගිණුම්ගත කර තිබුණි. මේ නිසා 2014 දෙසැම්බර් 31 දිනට වෙළඳ ණයගැතියන් ලෙස රු.9,662,075,549 ක සමුච්චිත ශේෂයක් නිරීක්ෂණය විය.

## 5.7 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 45 | 38 | 07 | - |
| (ii) | තෘතියික මට්ටම | 04 | 02 | 02 | - |
| (iii) | ද්විතියික මට්ටම | 104 | 65 | 39 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 71 | 171 | - | 100 |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | - | 27 | - | 27 |
| | **එකතුව** | **224** | **303** | **48** | **127** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 48 ක් පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

## 6. ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලය

### 6.2 ඇවර කිරීමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 ජනවාරි 11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලය අහෝසි කර එහි වත්කම් හා වගකීම් පැවරීමකින් තොරව 2012 පෙබරවාරි 01 දින සිට එහි කටයුතු ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය වෙත පවරා තිබුණි. එම පැවරීමෙන් අනතුරුව මණ්ඩලය සතුව තිබූ රු.5,046,870 ක් වටිනා සියලු පොත් පාසල් වෙත පරිත්‍යාග කර මණ්ඩලයට අනුයුක්ත කර සිටි අධ්‍යාපන අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය සඳහා ස්ථාන මාරුවීම් ලබා දී රු.9,834,534 ක් වූ මණ්ඩලයේ අවසාන ඉතිරි මුදල් ශේෂය 2012 ජුලි 25 දින මහා භාණ්ඩාගාරය වෙත යවා තිබුණි. එහි රු.17,085,337 ක් වූ ඉතිරි වත්කම් හා වගකීම් නිරවුල් කිරීමකින් තොරව 2012 ජුලි 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර තිබුණි. මේ පිළිබඳව 2012 දෙසැම්බර් 20 දිනැති විගණන විමසුමෙන් පසුව 2013 ජුනි 11 දින ඇවර කිරීමේ මූල්‍ය ප්‍රකාශන සකස්කර ඉදිරිපත් කර තිබුණි. නමුත් එම මූල්‍ය ප්‍රකාශනවල පැවති අඩුපාඩු හේතුවෙන් අවස්ථා තුනකදී සංශෝධනය කර අවසන් සංශෝධිත ඇවර කිරීමේ ගිණුම් ප්‍රකාශය 2014 ඔක්තෝබර් 14 දින සකස් කර විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි.

(ආ) ගිණුම්වල ශේෂ තුළ වූ රු.4,124,410 ක් වූ පහත විස්තර වන ජංගම වත්කම් මණ්ඩලයේ හිමිකම් ශේෂවලින් කපා හැර තිබූ අතර ඒ සඳහා මුදල් රෙගුලාසි 104

ප්‍රකාරව වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඔවුන්ගෙන් අයකර ගැනීමට හෝ මහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

(i) පොත් තොග ගිණුමේ ශේෂය අනුව රු.3,958,405 ක පොත් භෞතිකව නොතිබුණි. පොත් තොග පිළිබඳ භෞතික පරීක්ෂාවක් කිසිදු අවස්ථාවක සිදු නොකිරීම, පොත් ගබඩා ස්වභාවික හා කෘමි උවදුරුවලට ලක්වීමට ඉඩහැර තිබීම, පොත් තොග ලේඛන විධිමත්ව නඩත්තු නොකිරීම, විධිමත් ගබඩා පරිපාටි අනුගමනය නොකිරීම, පොත් තොග ගිණුම්ගත කිරීම්වල වැරදි පැවතීම සහ ඒ පිළිබඳව පෙර වර්ෂයන්හි සිදු කළ විගණනය පෙන්වා දී තිබුණු නිරීක්ෂණ කෙරෙහි අවධානය යොමු නොකිරීම යන කරුණු හේතුවෙන් මෙම පොත් තොග ගිණුම් ශේෂය ගොඩනැගී තිබුණි. මුදල් රෙගුලාසි 104 විධිවිධානයන්ට පටහැනිව 2011 දෙසැම්බර් 31 දිනදී ද තවත් රු.307,380 ක් වටිනා පොත් තොග ශේෂයක් කපා හැර තිබුණි.

(ii) ළමා ශබ්දකෝෂය සහ වීර සෝලියම් පොත මිලදී ගැනීම සඳහා බාහිර පාර්ශව දෙකකට රු.166,005 ක් වූ අත්තිකාරම් ලබා දී තිබුණත්, එම හිඟහිටි අත්තිකාරම් ශේෂ දෙක වර්ෂ ගණනාවක සිට පැවත එමින් තිබුණත්, අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2011 වර්ෂයේදී මණ්ඩලය විසින් රු.1,378,993 ක් ගෙවා රු.1,231,244 ක වටිනාකමට පමණක් ලී බඩු උපකරණ මිලදී ගෙන තිබු අතර වැඩිපුර ගෙවූ රු.147,749 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. අනතුරුව මණ්ඩලය වසා දැමීමේදී රු.1,231,244 ක් වටිනා ලී බඩු උපකරණ අධ්‍යාපන අමාත්‍යාංශය වෙත භාරදී රු.1,378,993 ක් වූ කාර්යාල ලී බඩු උපකරණ ගිණුම රු.147,749 ක ශේෂය නොපියවා වසාදැමීම කෙරෙහි වගකිව යුතු පාර්ශවයන්ගේ අවධානය යොමු වී නොතිබුණි.